සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 44 - ඉස්ලාම්

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Department of Examinations - Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021 (2022)

## 44 - ඉස්ලාම්

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

මෙම විෂයයේ දෙවන ප්‍රශ්න පත්‍රයේ කොටස් දෙකක් තිබේ. එයින් I කොටසෙන් ප්‍රශ්න 02 ක් ද, II කොටසෙන් ප්‍රශ්න 03 ක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට උත්තර සපයා දිය යුතුය.

**I කොටස**

ප්‍රශ්න දෙකකට - 02 x 20 = ලකුණු 40 යි

**II කොටස**

ප්‍රශ්න තුනකට - 03 x 20 = ලකුණු 60 යි

**එකතුව**

ප්‍රශ්න පහකට - 40 + 60 = ලකුණු 100 යි

**අවසන් ලකුණු ලබා දීමට**

I ප්‍රශ්න පත්‍රය - ලකුණු 50 යි

II ප්‍රශ්න පත්‍රය - ලකුණු 100 යි

**අවසන් ලකුණු = $50 + \frac{(100)}{2}$ = ලකුණු 100 යි**

Department of Examinations - Sri Lanka

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .................................................... √ △ 4/5
....................................................
....................................................

(ii) .................................................... √ △ 3/5
....................................................
....................................................

(iii) .................................................... √ △ 3/5
....................................................
....................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

### බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| ඉස්ලාම් I<br>இஸ்லாம் I<br>Islam I | 44 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- ✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✻ උත්තර පත්‍රයේ පසුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✻ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** අල්ලාහ් මිනිස් සමාජයට මඟ පෙන්වීම සඳහා වේදයන් දායාද කරන ලදී. ඒ අතුරෙන් සබූර් වේදය දායාද කරනු ලැබූ නබිතුමා වන්නේ
(1) ඊසා (අලෛ) තුමා ය. (2) මූසා (අලෛ) තුමා ය.
(3) ඉබ්රාහීම් (අලෛ) තුමා ය. (4) නූහ් (අලෛ) තුමා ය.
(5) දාවූද් (අලෛ) තුමා ය.

**2.** නබි (සල්) තුමා ට අල්-කුර්ආනය පහළ කළ ශතවර්ෂය
(1) ක්‍රි.ව. 6 (2) ක්‍රි.ව. 7 (3) ක්‍රි.ව. 9 (4) ක්‍රි.ව. 11 (5) ක්‍රි.ව. 12

**3.** "පාප කර්මයකට වැටේ ය යන බිය නිසා පාපී නොවන කටයුත්තක් හෝ අත් හැරීමට ඉදිරිපත් නොවන තාක් දෙවියන්ට බියපත් වන යහපත් පුද්ගලයන්ගේ ලැයිස්තුවෙහි කිසිදු මිනිසෙකු සිටිය නොහැක." යන නබි වදන මගින් තහවුරු කරන්නකි
(1) තවක්කුල් (2) මහබ්බත් (3) රිලා (4) වරඋ (5) තව්බා

**4.** නබි (සල්) තුමාට කුඩා වියේදී කිරි පෙවූ හලීමා තුමිය
(1) බනූ හාෂිම් ගෝත්‍රයට අයත් කෙනෙකි. (2) කුලාආ ගෝත්‍රයට අයත් කෙනෙකි.
(3) බනූ මුත්තලිෆ් වංශයට අයත් කෙනෙකි. (4) සෑදු බින් බක්ර් ගෝත්‍රයට අයත් කෙනෙකි.
(5) නබි (සල්) තුමාගේ පවුලට අයත් කෙනෙකි.

**5.** "සියලුම මිනිසුන් අල්ලාහ්ගේ පවුල වේ. එම පවුලට ඉතාමත් ඵලදායී වන්නන් අල්ලාහ්ගේ වඩාත් කැමති අය බවට පත් වේ." යන්න
(1) නබි (සල්) තුමාගේ ප්‍රකාශයකි. (2) අල්-කුර්ආන් වදනකි.
(3) අලි (රලි) තුමාගේ ප්‍රකාශයකි. (4) ඉමාම් මාලික් (රහ්) තුමාගේ ඉගැන්වීමකි.
(5) නවීන යුගයේ විද්වතෙකුගේ අදහසකි.

**6.** 'උමර් (රලි) තුමාගේ පාලන සමයේ ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වාදෙන ලදී' යන මතය ඉදිරිපත් කළ පුද්ගලයා වන්නේ
(1) ඉබනු බතූතා ය. (2) ඉබනු ෂහ්රයාර් ය. (3) ටොලමි ය.
(4) මාර්ෂල් බෑම් හාල් ය. (5) ආචාර්ය හමීදුල්ලා ය.

**7.** තාබිඊන් සමයේ විද්වතුන්ගේ හදීස් සම්පාදනයන් කෙසේ හැඳින්වේ ද?
(1) මුසන්නෆ් (2) ජාමිඋ (3) මුස්නද්
(4) කිතාබ් (5) සුනන්

8. ඉස්ලාමික ව්‍යවහාරයට අනුව ස්ථිර කරන ලද කාර්යයක් එලෙසම අඛණ්ඩව පවත්වා ගැනීම
(1) ඉස්තිස්ලාහ් වේ.
(2) ෂරඃ සාබික් වේ.
(3) කියාස් හෆී වේ.
(4) ඉස්තිස්හාබ් වේ.
(5) ඉස්තිහ්සාන් වේ.

9. මධ්‍යම ආසියාවේ බිහි වූ 'නක්ෂබන්දියා' තරීකා වේ නිර්මාතෘ වන්නේ
(1) සෙයියද් අහමද් ෂරීෆ් (රහ්) තුමා ය.
(2) කාති මුහම්මද් (රහ්) තුමා ය.
(3) අබ්දුල් කාදිර් ජීලානි (රහ්) තුමා ය.
(4) හාජා මුර්තුදීන් (රහ්) තුමා ය.
(5) අබූ හාමිද් අල් ගස්සාලි (රහ්) තුමා ය.

10. 'මහ්රම් මුඅබ්බද්' යන පදයෙන් සඳහන් කරන්නේ
(1) ස්ථිර වශයෙන් ම විවාහ වීමට අනුමැතිය නොමැති අය යන්න ය.
(2) තාවකාලිකව විවාහවීමට අනුමැතිය නොමැති අය යන්න ය.
(3) විවාහයක දී 'වලි' ලෙස පෙනී සිටීමට අනුමැතිය නොමැති අය යන්න ය.
(4) ස්ථිර වශයෙන් ම විවාහ වීමට අනුමැතිය ඇති අය යන්න ය.
(5) මියගිය කෙනෙකුගේ දේපළෙ හි පංගුවක් ලබා ගැනීමට අනුමැතිය ඇති කෙනෙක් යන්න ය.

11. තම ස්වාමි පුරුෂයා තමාට වියදම් කරන ක්‍රියාවේ දී මසුරුකම්පාන බව නබි (සල්) තුමාට පැමිණිලි කළ ස්ත්‍රිය
(1) හන්සා වේ.
(2) සල්මා බින්ද් සකර් වේ.
(3) සෆියියා වේ.
(4) උම්මු ජමීල් වේ.
(5) හින්දා වේ.

12. 'ෆර්ලු, සහ නෆිල්' යන පදයන් හි අර්ථයන් පිළිවෙලින්
(1) අනුමත කරන ලද දේ, තහනම් කරන ලද දේ
(2) කැමති දේ , අකැමැති දේ
(3) අනුගමනය කළ හැකි දේ, පිළිගත හැකි දේ
(4) අනුමත කළ හැකි දේ, පිළිගැනීමට හැකි දේ
(5) අනිවාර්ය කරන ලද දේ, උද්‍යෝගිමත් කරන ලද දේ

13. Zසකාත් රැස්කර බෙදාහැරීමේ කාර්යයෙහි යෙදෙන්නන් කෙසේ හඳුන්වන්නේ ද?
(1) ෆකීර්
(2) මිස්කීන්
(3) ආමිල්
(4) මුඅල්ලෆතුල් කුලුබ්
(5) ඉබ්නු සබීල්

14. අල්-කුර්ආන්, සුන්නා හි පරම්පරාවන්ට අයත් දේපළ පංගු ඉතා පැහැදිලිව අර්ථ දක්වා ඇති 'අස්හාබුල් ෆුරූල්' යන කාණ්ඩයට අයත් **නොවන්නේ**
(1) ස්වාමිපුරුෂයා
(2) භාර්යාව
(3) පුතාගේ පුතා
(4) මව
(5) පියා

15. නබි (සල්) තුමාගේ දූතයෙකු ලෙස පැමිණි 'වහබ් ඉබ්නු අබි හබ්සා' යන සහාබි ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර ගිය රට
(1) යෙමනයයි.
(2) සුඩානයයි.
(3) ඉන්දුනීසියාවයි.
(4) චීනයයි.
(5) සුමාත්‍රායි.

16. ඉස්ලාම් සහාය මූලාශ්‍රයන් අතුරෙන් 'මස්ලහා මුර්සලා' යන්න
(1) ඒකමතික තීරණයකි.
(2) මිනිසාගේ යහපත උදෙසා ආරක්ෂා කිරීම ය.
(3) සුදුසු ලෙස දැකීම ය.
(4) සම්ප්‍රදායක් වේ.
(5) සසඳා බැලීම ය.

17. ඉස්ලාමික විවාහයන් හී දී 'වලි' ලෙස හැඳින්වෙන්නේ
(1) විවාහය ඉස්ලාමීය ක්‍රමයට පවත්වන්නා
(2) විවාහයක දී සාක්ෂිකරු ලෙස සිටින්නා
(3) මනාලියගේ මහ්රම් වූ ඥාතියා
(4) මනාලියගේ භාරකරු ලෙස සිටින්නා
(5) විවාහය ලියාපදිංචි කරන්නා

Department of Examinations - Sri Lanka

18. හදීස් කලාවේ 'මක්තූඃ' යනුවෙන් හැඳින්වෙන්නේ, දැනුම් දෙන්නන්ගේ පාර්ශ්වයේ
(1) තාබිඊන්වරුන් දක්වා යන හදීස් ය.
(2) සහාබි දක්වා යන හදීස් ය.
(3) අමතක වූවෙකු ඇතුළත් වී තිබීම ය.
(4) අනුපිළිවෙලෙහි කෙනෙකු අත්හැරී තිබීම ය.
(5) දෝශාරෝපණයට ලක් වූවකු ඇතුළත්ව තිබීම ය.

19. තත්කාලීනව ජීවත් වන මුජ්තහිද්වරු එකිනෙක අය සඳහන් කළ කරුණක් පිළිබඳව තම ස්ථාවරය පැහැදිලිව ඉදිරිපත් කරන අතර ඒකමතික තීරණයකට එළඹීම
(1) ඉජ්මාඋ සහාබා වේ. (2) ඉජ්මාඋ සරීහ් වේ. (3) ඉජ්මාඋ මුරක්කබ් වේ.
(4) ඉජ්මාඋ අක්සරියියා වේ. (5) ඉජ්මාඋ සුකූති වේ.

20. කුර්ආන් කලාවේ 'මුහ්කම්' යනු
(1) නිශ්චිත අර්ථයක් පමණක් දැක්වෙන පැහැදිලි පදයන් ය.
(2) අර්ථය අපැහැදිලි පදයන් ය.
(3) අල්-කුර්ආන් පරිච්ඡේදවල ආරම්භයේ තිබෙන තනි අක්ෂරයන් ය.
(4) අකීදා සම්බන්ධ වූ වාක්‍යයන් ය.
(5) අල්-කුර්ආනයේ අවලංගු කරන ලද වාක්‍යයන් ය.

21. "ඔබට පාලකයාගේ පුතණුවන් කෙසේ කනේ පහරක් දුන්නේ ද එලෙසම ඔහුට කනේ පහරක් දෙන්න." යැයි කලීෆා උමර් (රලි) තුමාගේ ප්‍රකාශය හා සම්බන්ධ පාලකයා වන්නේ
(1) අම්රිබ්නු ආස් ය. (2) මූසා බින් නුසෙයර් ය.
(3) උක්බත් ඉබ්නු නාෆිඃ ය. (4) මුආද් ඉබ්නු ජබල් ය.
(5) අබ්දුල්ලා ඉබ්නු උම්මි මක්දූම් ය.

22. ඉස්ලාම්හි විවාහ මංගලෝත්සවයක් පැවැත්වීමේ දී වැලකී සිටිය යුතු කාර්යයක් වන්නේ
(1) ස්වාමි පුරුෂයා භෝජන සංග්‍රහයක් සූදානම් කොට විවාහය ප්‍රසිද්ධියට පත් කිරීම ය.
(2) නිශ්චිත යාඥා මගින් නව යුවලට ආශීර්වාද කිරීම ය.
(3) මුලින් තීරණය කරන ලද මහර් ප්‍රමාණය මනාලියගේ භාරකරු වෙත පිළිගැන්වීම ය.
(4) ආභරණ හා අඩිමිල සහිත ඇඳුම් අන්දවා මනාලිය ප්‍රදර්ශනය කිරීම ය.
(5) රජයේ විවාහ ලියාපදිංචිකරුවෙකු කැඳවා විවාහය ලියාපදිංචි කිරීම ය.

23. "අල් අම්රු බිල් මඃරූෆ් වන්නහ්යු අනිල් මුන්කර්" යනු
(1) යහපත් අයව මිතුරන් කර ගැනීමත් අයහපත් අයව ප්‍රතික්ෂේප කිරීමත් වේ.
(2) යහපත් දේ කියා දීමත් අයහපත් දේ වලින් වැලක්වීමත් වේ.
(3) ඉස්ලාමික මාර්ගයේ පවුල් නඩත්තු කිරීම ය.
(4) සියලුදෙනා සහෝදරයින් ලෙස පිළිගැනීම ය.
(5) සමාජ අතර සංහිදියාව ආරක්ෂා කිරීම ය.

24. ස්වාමිපුරුෂයා විසින් ඉටුකළ යුතු යුතුකම්වලට ඇතුළත් **නොවනුයේ**,
(1) භාර්යාව නඩත්තු කිරීම ය.
(2) භාර්යාව ආරක්ෂා කිරීම ය.
(3) ආගමික කටයුතු ඉටු කිරීමට සහය වීම ය.
(4) භාර්යාවගේ පවුලේ අයට අඛණ්ඩව ආහාර සැපයීම ය.
(5) භාර්යාවට අයත් මහර් ප්‍රමාණය භාර දීම ය.

25. ශ්‍රී ලංකාවේ 10වන ශත වර්ෂයේ ජීවත් වී මරණයට පත් වූ කාලිද් ඉබ්නු අබි බකායාගේ සොහොනේ මධ්‍යයේ තිබූ ගල පරීක්ෂණයට භාජනය කරන ලද්දේ
(1) ජේම්ස් ටෙනන්ට් විසිනි. (2) එස්. පරණවිතාන විසිනි.
(3) මහාචාර්ය සැමුවෙල් ලී විසිනි. (4) ආචාර්ය වසන්තරා මෝහන විසිනි.
(5) ආචාර්ය පුක්රි විසිනි.



Department of Examinations - Sri Lanka

26. "තනි පුද්ගලයින්ගේ සමාජ අයිතිවාසිකම් ලබාදීම රජයේ වගකීමකි" යන්න සහතික කිරීමට කලිෆා උමර් (රලි) තුමා සිදුකළ ක්‍රියාවලිය කුමක් ද?

(1) ගනීමත් ද්‍රව්‍ය 'හුමුස්' යන රජයේ කොටස යුද්ධයේ දී කැපවීමකින් සහභාගී නොවූ දුප්පත් ජනයාට බෙදා දීම.
(2) දිම්මි වයෝවෘධයෙකුගේ ජීස්යා බද්ද ඉවත්කොට ඔහුගේ නඩත්තු වියදම් මුස්ලිම්වරුන්ගේ බෛතුල්මාල් මඟින් වියදම් කිරීම.
(3) භාණ්ඩාගාරය සැකසී තිබෙනුයේ ධනය රැස්කර තැබීමට පමණක් නොවේ. ඒ වෙනුවට සමාජ සත්ක්‍රියාවලට වියදම් කිරීමට ය යන්න ප්‍රසිද්ධ කිරීම.
(4) 'ධනවත් අය සතුව තිබෙන අතිරික්ත සම්පත් ලබාගෙන දුප්පතුන්ට බෙදා දෙමි' යන්න ප්‍රකාශයට පත් කිරීම.
(5) දුප්පතුන් බඩගින්නෙන් පෙළීමට හෝ ඇඳුම් නොමැතිව දුෂ්කර තත්වයට පත්වීමට හෝ සිදුවුවහොත් එය ධනවතුන් තම යුතුකම් ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිවිපාක ලෙස හැඟවීම.

27. පහත ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - මදීනාහි ඉපිද ජීවත්ව එහිදීම මරණයට පත් වූවෙක්
B - අල්-උම්මු යන ග්‍රන්ථය රචනා කළ තැනැත්තා
C - 'ඉමාමුල් මදීනා' යන නමින් ප්‍රසිද්ධ වූ පුද්ගලයා
D - ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතුරෙන් වැඩි දෙනෙක් මොහුගේ මද්හබය අනුගමනය කරති.
E - මොහු බැග්ඩෑඩයේ ප්‍රකාශිත මත 'කවුලුල් කදීම්' ලෙස හැඳින්වේ.
F - මුඅත්තා යන ග්‍රන්ථය රචනා කළ පුද්ගලයා.

ඉහත සඳහන් ඉමාම් මාලික් (රහ්) තුමා හා සම්බන්ධ වූ ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A B C (2) A D E (3) A C F (4) B C D (5) B C F

28. පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - ඉස්ලාම් හි මූලාශ්‍රයන් වර්ග මත පදනම් වී ඇත.
B - නබි (සල්) තුමාගේ ඉගැන්වීම් අරාබි සමාජයට පමණක් අයිති වේ.
C - ඉස්ලාම් පැවිදි ජීවිතය අවධාරණයට ලක්කරයි.
D - ඉස්ලාම් සුනම්‍ය මෙන්ම සුනම්‍ය නොවන ආගමකි.
E - ඉස්ලාම් මිනිසාගේ අධ්‍යාත්මික, ලෞකික ක්‍රියාවන් සියල්ල ඇතුළත් ආගමකි.
F - ඉස්ලාම්හි මිනිසා උසස් මැවීමක් ලෙස පිළිගැනේ.

ඉහත සඳහන් ප්‍රකාශවලින් ඉස්ලාම්හි විශේෂාංගයක් ඇතුළත් වරණය කුමක්ද?

(1) A B C (2) A C D (3) A D E (4) B C D (5) B E F

29. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - කිසියම් ආකාරයට හානියක් ඇතිකරන රැකියාවක් හැර යහපත් ඉපයීම්වලට සියලුම දොරටු ඉස්ලාම් විවෘත කර ඇත.
B - තමාගේ ආහාර අවශ්‍යතා අල්ලාහ් වෙත භාරදී කිසිදු ඉපයීමක් නොමැතිව මස්ජිදයේ සිටි අයට උමර් (රලි) තුමා අවවාද කොට ඇත.
C - "පක්ෂීන් උදෑසන හිස්බඩින් පියාසර කරගොස් සවස් කාලයේ බඩ පිරුණු ආකාරයට නැවත පැමිණෙති." යන නබි වදන මිනිසා ආහාර සෙවීමට උත්සාහ දැරීමේ අවශ්‍යතාවය හඟවයි.
D - තමාගේ ඥාතීන් හා අසල්වාසීන්ට උදව් කිරීම වෙනුවෙන්, රැකියාවන් හි නිරතවී ආදායම් ඉපයීමට ඉස්ලාම් අවධාරණය කරන්නේ නැත.
E - ඉපයීමේ ශක්තිය ඇති කෙනෙකු කිසිදු රැකියාවක නිරත නොවී Zසකාත් බලාපොරොත්තුවෙන් සිටීම ඉස්ලාම් ප්‍රතික්ෂේප කරයි.

ඉහත සඳහන් ඉස්ලාම්හි ඉපයීමෙහි වැදගත්කම පිළිබඳව ප්‍රකාශ සහිත වරණය තෝරන්න.

(1) A සහ B පමණකි. (2) A, B සහ C පමණකි.
(3) A, B, C සහ D පමණකි. (4) A, B, C සහ E පමණකි.
(5) A, B, C, D සහ E යන සියල්ල වේ.

Department of Examinations - Sri Lanka

**30.** පහත සඳහන් කරුණු සලකන්න.

A - නබි ඊසා (අලෛ) තුමාගේ පැමිණීම
B - යඃජුජ්, මඃජුජ් කණ්ඩායම්වල පැමිණීම
C - සූර්යයා බටහිරින් උදාවීම
D - නොදැනුවත්කම වැඩි වීම
E - ගොඩනැගිලි ඉදිකිරීමේ තරඟකාරීත්වයක් ඇතිවීම

ඒවායින් ලෝක අවසානය සඳහා වූ මහා සංකේත පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) A B C (2) A B D (3) B D E (4) B A E (5) C B E

**31.** ඉස්ලාම් ඉතිහාසයේ බෛතුල්මාල් පරිපාලනයට ආරක්ෂා සහිත තනි තනිවූ ගොඩනැගිලි ඉදිකිරීමට පෙර එය

(1) නබි (සල්) තුමාගේ භාරයේ පැවතී ය.
(2) කලීෆාවරුන්ගේ අධීක්ෂණය යටතේ පැවතී ය.
(3) මස්ජිදය ආසන්නවූ පොදු ස්ථානයක පිහිටියේ ය.
(4) ආණ්ඩුකාරවරු භාරයේ පැවතී ය.
(5) බෛතුල්මාල් වෙනුවෙන් නියම කරන ලද අයගේ ආරක්ෂාව යටතේ පැවතී ය.

**32.** පහත දැක්වෙන්නේ නීති මූලාශ්‍රයන් පිළිබඳ වූ ප්‍රකාශයන් ය.

A - විනිශ්චයක් දීමට එකකට වඩා වැඩි වූ මුජ්තහිද් තිබිය යුතු වේ.
B - ප්‍රදේශ, වර්ණ, භාෂා වෙනස්කම් හැර සියලුදෙනාගේ මතයෙහි එකඟතාවක් තිබිය යුතු ය.
C - බහුතර මුජ්තහිද්වරුන්ගේ තීරණය විනිශ්චය ලෙස ගත හැකිය.
D - මුජ්තහිද්වරුන්ගෙන් වැඩිදෙනෙක් නියමිත විනිශ්චයකට එකඟවන අතර තවත් කිහිපදෙනෙකු එයට විරුද්ධ විය හැකිය.
E - සංසන්දනය කිරීමේ පදනමින් අලුත් ගැටලුවලට විනිශ්චයක් සැපයීමට අනුමත කර ඇත.
F - නබිතුමාගේ අනුගාමිකයන්ගේ අදහස් හා ජීවිතය ද්විතීය මූලාශ්‍රයක් වශයෙන් ගැනේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් ඉජ්මා සම්බන්ධ අදහස් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A B C D (2) A B C E (3) A B C F (4) A C E F (5) B C D F

**33.** මහා වංශයේ 'යවන' යන පදය පළමුව ග්‍රීකයින් සහ පසුව අරාබියානුවන් ලෙස හැඳින්වූ බව කියන මහාවංශ භාෂා පරිවර්තකයා කවු ද?

(1) ආචාර්ය සිරිමා කිරිබමුණ
(2) කුමාරි ජයවර්ධන
(3) සර් තෝමස් ආර්නොල්ඩ්
(4) ආචාර්ය ලෝණා දේවරාජ
(5) විල්හෙල්ම් ගයිගර්

**34.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - මතභේදයකදී එකිනෙකා ගරුකොට හැසිරීම.
B - මතභේද ඇති කළ අයගේ පරස්පරතාවය සාධාරණීකරණය කිරීම.
C - අකීදා වැනි පදනම් වූ කරුණුවලදී ඒවාට ඉඩදී එකඟතාවන්ට පැමිණීම.
D - අදහස්වල ආත්මාර්ථකාමී තත්ත්වයෙන් වැලකී සිටීම.
E - වාද විවාදවලදී අනෙකා ගැන හොඳහිත වර්ධනය කරගැනීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් මතභේදයකදී සැලකිය යුතු පිළිවෙත් ඇතුළත් වරණය තෝරන්න.

(1) A B C D (2) A B D E (3) A B C E (4) B C D E (5) C D E A

**35.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - උර්ෆ්ව නීති මූලාශ්‍රයක් ලෙස ගැනීම ඇතැම් නීති විශාරදයන් අනුමත කරති.
B - මිනිසා ක්‍රියාකිරීමේ නිදහස නොමැති අයෙකු ලෙස ප්‍රකාශ කිරීම මුඃතසිලා සංකල්පයයි.
C - හුදෛබියා සම්මුතියේ දී කුරෛෂ්වරුන් හා සමාදානය ගැන කථාකිරීමට, කලීෆා උමර් (රලි) තුමා මක්කා නගරයට යැවීම.
D - පෘතුගීසීන් ශ්‍රී ලංකාවෙන් පලවා හැරීමට මුස්ලිම්වරුන් ද එක්ව යුද්ධ කළ හ.
E - ශ්‍රී ලංකාවේ ඉස්ලාමය අරාබියානුවන් විසින් හඳුන්වා දෙන ලදී.

ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ පමණක් තෝරන්න.

(1) A B C (2) A B D (3) A C D (4) A D E (5) B C E

Department of Examinations - Sri Lanka

- අංක **36** සිට **40** දක්වා වූ සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ දී ඇති තොරතුරු ලබා දී ඇත. **X** තීරුවේ ඇති තොරතුරු **Y** තීරුවේ ඇති තොරතුරු සමඟ කිසියම් හෝ ආකාරයකට සම්බන්ධ වී ඇත. නිවැරදිව **X** තීරුවට අදාළව **Y** තීරුවේ ඇති පිළිතුරු ගැළපෙන පරිදි අනුපිළිවෙළ සැකසීමේ දී ලැබෙන පිළිතුර තෝරන්න.

**36.**

| X | Y |
|---|---|
| (i) මෛඋල් මුඅජ්ජල් | A - වගකීම ලබාදීම |
| (ii) කර්ලුල් හසන් | B - තැරැව් සේවය |
| (iii) අත්තෑමින් | C - පොලී නොමැති අලංකාර වූ ණය |
| (iv) වකාලා | D - කල්තබන ලද ගනුදෙනු වෙළදාම |
| (v) සම්සරා | E - රක්ෂණය |
| | F - උකස් තැබීම |

(1) A B C D E (2) A C D E F (3) B C D E F (4) D C E A B (5) D C F E B

**37.**

| X | Y |
|---|---|
| (i) ඉමාම් බුහාරි | A - හි : 209 |
| (ii) ඉමාම් මුස්ලිම් | B - හි : 215 |
| (iii) ඉමාම් තිර්මිදි | C - හි : 201 |
| (iv) ඉමාම් අබුදාවුද් | D - හි : 204 |
| (v) ඉමාම් නාසාඊ | E - හි : 194 |

(1) A B C D E (2) B C D A E (3) C D E B A (4) D E A B C (5) E D A C B

**38.**

| X | Y |
|---|---|
| (i) මුඃතසිලාවරු | A - ඉමාමත් සංකල්පය අනුගමනය කරන්නන් |
| (ii) කවාරිජ්වරු | B - ඊමානයට සහ අමල්වලට සම්බන්ධ නැත |
| (iii) ෂීආවරු | C - අලි(රලි)තුමාගේ කණ්ඩායමෙන් බෙදී ගිය අය |
| (iv) මුර්ජිආවරු | D - සියල්ල කලාකද්ර් අනුව සිදුවේ. |
| (v) ජබරියාවරු | E - අල්-කුර්ආන් අල්ලාහ් විසින් මවන ලද්දකි. |

(1) A B C D E (2) A C D B F (3) B E A D C (4) D C F A B (5) E C A B D

**39.**

| X | Y |
|---|---|
| (i) මකාසිද් | A - නීතිරීති |
| (ii) කවාඉද් ෆික්හියා | B - අරමුණු |
| (iii) හාජියාත් | C - සුඛෝපභෝගී තත්ත්වය |
| (iv) තහ්සීනියාත් | D - අත්‍යවශ්‍ය තත්ත්වය |
| (v) ලරූරියාත් | E - අවශ්‍යතාවයේ තත්ත්වය |

(1) A B C D E (2) A C B D E (3) A D C E B (4) B A E C D (5) B C D E A



Department of Examinations - Sri Lanka

**40.**

| X | Y |
|---|---|
| (i) සලාතය | A - ලෝක මුස්ලිම් සමාජයේ සාමාජිකයෙක් වීම |
| (ii) zසකාත් | B - අසල්වැසියන්ගේ අයිතිවාසිකම් අගය කොට ජීවත් වීමේ තත්වය උදාවීම |
| (iii) උපවාසය | C - වගකීම් පිළිබඳ හැඟීම්, වෙලාවට වැඩ කිරීම, කඩිසරකම ඇති වීම |
| (iv) හජ් | D - ලෝබකම තුරන් වී ත්‍යාගශීලීත්වය වර්ධනය කිරීම |
| (v) හුකූකුල් ඉබාද් | E - අනෙකාගේ දුකේදී පිහිටවීමේ මානසිකත්වය ඇති වීම |

(1) A B C D E (2) A C B D E (3) B C A D E (4) C D E A B (5) C B D E A

**41.** ඉස්ලාමික පාරම්පරික උරුමයෙහි 'දුල් අර්හාම්' යනුවෙන් හැඳින්වෙන අය
(1) මියගිය පුද්ගලයෙකුගේ පවුලේ ළඟම ඥාතීන් වේ.
(2) මියගිය පුද්ගලයාගේ විවාහ පාර්ශ්වයේ ඥාතීන් වේ.
(3) මියගිය පුද්ගලයාගේ කිරි ඥාතීන් වේ.
(4) උරුමක්කරුවන්ට අයිති පංගු දුන්පසු ශේෂ වූ පංගු ලබාගන්නන් වේ.
(5) නිශ්චිත ධනයට උරුමක්කරුවන් ලෙස තුන්වන පාර්ශවයේ එක්වන අය වේ.

**42.** තාබිඊන්වරුන්ගේ ආරම්භක සමයේ හදීස් ක්ෂේත්‍රය මුහුණ පෑ ගැටලුවලට හේතු **නොවූයේ**
(1) කුලෆාඋර් රාෂිදූන්වරුන්ට පසුව පාලන පිහිටුවාගත් පාලකයන් කොටසකගේ දුර්වල ක්‍රියාවන් ය.
(2) කුලෆාඋර් රාෂිදූන්වරු හදීස් ආරක්ෂා කිරීමට ගන්නා ලද උත්සාහයන් පසුව අත්හැර දැමීම ය.
(3) ලිවීමට, කියවීමට හැකියාව ඇති අයගේ අඩුවක් පැවතීම ය.
(4) ශත වර්ෂයක් දක්වා හදීස් එකලස් නොකිරීම ය.
(5) තාර්කික පදනම මත විනිශ්චයක් දීමේ තරමට තත්ත්වය දුර්වලව තිබීම ය.

**43.** මහබ්බතුර් රසූල් දැක්වෙනුයේ
(1) අල්ලාහ්ගේ දූතයා යන්න ය.
(2) මිනිස් සමාජයට ආදර්ශමත් යන්න ය.
(3) නබිතුමා කෙරෙහි ආදරය දැක්වීම ය.
(4) මිනිසා විසින් අනුගමනය කිරීමට සුදුස්සා යන්න ය.
(5) නබිතුමා කෙරෙහි අධික ලෙස සලවාත් කීම ය.

**44.** මියගිය කෙනෙකුගේ දේපල භාවිතා කරන විට පහත සඳහන් කුමන කරුණක් කෙරෙහි ප්‍රමුඛතාවය දිය යුතු ද?
(1) වසියියත් ඉටුකිරීම
(2) හිමිකරුවන්ට දේපළ බෙදා දීම
(3) අවමංගල්‍ය කටයුතු සූදානම් කිරීම
(4) මියගිය පුද්ගලයා වෙනුවෙන් දානමාන කිරීම
(5) මියගිය පුද්ගලයාගේ ණය පියවීම

**45.** "කාරණා හතරක් වාසනාව මත පදනම් වන්නේ ය. හොඳ භාර්යාව, විශාල නිවාසය, හොඳ අසල්වැසියා...." යන හදීසය සම්බන්ධව නබි (සල්) තුමා සඳහන් කළ හතරවන ගුණාංගය කුමක් ද?
(1) හොඳ ළමයින්
(2) හොඳ වාහනයක්
(3) ආදායම් උපයන රැකියාවක්
(4) හොඳ මිතුරෙක්
(5) ඉස්ලාමික පරිසරයක්

Department of Examinations - Sri Lanka

● අංක 46 සිට 50 දක්වා ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවන ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 46. | සියලු රසූල්වරුන්ට දායාද කරන ලද දීන් එකක් ලෙසත් නීති වෙනස් වූවත් ලෙසත් දක්නට තිබුණි. | ඉමාම් අබූල් හසන් අල් අෂ්අරි (රහ්) තුමා ඉස්ලාම් අකීදාව පිරිසිදු හැඩයෙන් ආරක්ෂා කිරීමට විශාල දායකත්වයක් ලබා දී ඇත. |
| 47. | අල්-කුර්ආන් දෙවියන්ගේ ශුද්ධ වූ වදන් වේ. | අල්-කුර්ආන් හි අන්තර්ගතය වචන භාවිතය, උපමා, ව්‍යාකරණ විධි ආදිය මිනිසාගේ හැකියාවන් ගෙන් ඔබ්බට ගිය දේවල් වේ. |
| 48. | හිජ්රි 5 වන ශත වර්ෂයේ ෆික්හ් ක්ෂේත්‍රයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වේ. | අල්-කුර්ආනය වටහා ගැනීමට හදීස් අවශ්‍ය නොවේ. |
| 49. | අකීදා, ඉබාදා, හුදූද්, කෆ්ෆාරා ආදියෙහි ඉජ්තිහාද් තිබිය හැකිය. | නව ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ දී ඉජ්තිහාද් අවශ්‍ය වේ. |
| 50. | ආගමික විනිශ්චයන් දීමේ දී අල්-කුර්ආන් මූලාශ්‍ර නොලැබෙන විට සුන්නා මූලාශ්‍ර ලෙස ගත යුතු ය. | ඉමාම් අබූ හනීෆා (රහ්) තුමා කියාස්, ඉස්තිහ්සාන් ආදිය නීති සම්පාදනයට පදනම් කර නොගැනුණි. |

* * *

Department of Examinations - Sri Lanka

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

විෂයය අංකය / பாட இலக்கம் **44**    විෂයය / பாடம் **ඉස්ලාම්**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 5 | 21. | 1 | 31. | 3 | 41. | 5 |
| 02. | 2 | 12. | 5 | 22. | 4 | 32. | 1 | 42. | 3 |
| 03. | 4 | 13. | 3 | 23. | 2 | 33. | 5 | 43. | 3 |
| 04. | 4 | 14. | 3 | 24. | 4 | 34. | 2 | 44. | 3 |
| 05. | 1 | 15. | 4 | 25. | 3 | 35. | 4 | 45. | 2 |
| 06. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 4 | 46. | 1 |
| 07. | 3 | 17. | 4 | 27. | 3 | 37. | 5 | 47. | 5 |
| 08. | 4 | 18. | 1 | 28. | 3 | 38. | 5 | 48. | 4 |
| 09. | 2 | 19. | 2 | 29. | 4 | 39. | 4 | 49. | 2 |
| 10. | 1 | 20. | 1 | 30. | 1 | 40 | 4 | 50 | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 × 50 = 50

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

44 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) 'කියාස්' යනු කුමක් ද? (ලකුණු 02 යි.)
   (ii) කියාස් හි රුකුන් **හතර** සඳහන් කොට නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
   (iii) කියාස් වර්ග සඳහන් කොට ඒවායින් **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iv) කියාස් හි ප්‍රයෝජන **හතරක්** සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

2. (i) 'තලාක්' යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 02 යි.)
   (ii) තලාක් රජ්ඉ, බාඉන් යන බෙදීම් **දෙක** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
   (iii) 'ඉද්දා' යන්න අර්ථ දක්වා එහි වර්ග **දෙකක්** සඳහන් කොට විස්තර කරන්න. (ලකුණු 06 යි.)
   (iv) ඉද්දා හි අරමුණු **හතරක්** සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

3. (i) ඉස්ලාමික බැංකු ක්‍රමය අර්ථ දක්වන්න. (ලකුණු 02 යි.)
   (ii) ඉස්ලාමික බැංකු ක්‍රමයේ මූලධර්ම **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
   (iii) මුආමලාත් සම්බන්ධ වූ ඉස්ලාමික සදාචාරාත්මක අගයන් **හතරක්** සඳහන් කොට ඉන් **දෙකක්** ගැන පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iv) බෙයිතුල් මාල් පරිපාලනය සම්බන්ධව කලීෆාවරු අනුගමනය කළ ක්‍රියා **හතරක්** හඳුනාගෙන විස්තර කරන්න. (ලකුණු 08 යි.)

## II කොටස

4. (i) ඉස්ලාමීය සමාජ ජීවිතයෙහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)
   (ii) ඉස්ලාමීය සමාජ සංවිධානයෙහි විශේෂාංග අතුරෙන් සමානාත්මතාවය හා සහෝදරත්වය ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

5. (i) ඉස්ලාමීය උගන්වන මානව හිමිකම් **පහක්** හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)
   (ii) මුස්ලිම්වරයෙකුගේ ජීවිතය සකස් කිරීමට මස්ජිදය දරන කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 10 යි.)

Department of Examinations - Sri Lanka

**6.** (i) ඉස්ලාමයේ ඉජ්තිහාද් දරණ වැදගත්කම අල්-කුර්ආන් සහ සුන්නා සාධක සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ජීවන ඉතිහාසය කෙටියෙන් සඳහන් කොට ෆික්හ් ක්ෂේත්‍රයේ වර්ධනයට සිදුකළ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**7.** (i) ශ්‍රී ලංකා ඉතිහාසයේ සිංහල රජවරු මුස්ලිම් සමාජය හා පවත්වාගෙන ගිය මිත්‍රශීලී සබඳතාවන් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය තුළ පහත ඒවායෙහි සබඳතාව පරීක්ෂා කරන්න.

(අ) මාන්තයි වරාය

(ආ) ඉබ්නු බතූතා (ලකුණු 10 යි.)

**8.** පහත අංශ ගැන කෙටි සටහන් ලියන්න.

(i) පරලොව ඇත යන්නට සාක්ෂි (ලකුණු 05 යි.)

(ii) ඉස්ලාමීය ස්වර්ගස්ථ ජීවිතය (ලකුණු 05 යි.)

(iii) ඉස්ලාමීය විවාහයට පෙර සූදානම (ලකුණු 05 යි.)

(iv) අරාබි-ශ්‍රී ලංකා සබඳතා (ලකුණු 05 යි.)

* * *

Department of Examinations - Sri Lanka

## I කොටස

1. (i) 'කියාස්' යනු කුමක් ද?

**භාෂාමය තේරුම**

මැනීම, ගණනය කිරීම, සමකිරීම, සසඳා බැලීම

**ඉස්ලාමීය භාෂාමය තේරුම**

නීතිය පැහැදිලි නැති නව ප්‍රශ්නයක් පිළිබඳ විනිශ්චය, නීතියේ පැහැදිලිව දක්වා ඇති සමාන කාරණයක් හා සසඳා එම නව ප්‍රශ්නයකට විනිශ්චය ලබා දීම.

*(භාෂාමය තේරුම සඳහා එක් ලකුණක්ද,*

*ඉස්ලාමීය භාෂාමය තේරුම සඳහා එක් ලකුණක්ද,*

*එකතුව ලකුණු 2ක් ලබා දෙන්න)*

(ii) කියාස් හි රුකුන් **හතර** සඳහන් කොට නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

1. අල් - අස්ල්
2. අල් - ෆර්උ
3. අල් - ඉල්ලත්
4. අල් - හුකුම්

- අල් අස්ල් - උපමා/ මූලික ගැටළු/ මූලික/ මූලික විෂය
  අල්කුර්ආන්, සුන්නා හා ඉජ්මාහි නීතිය පැහැදිලිව දක්වා ඇති කරුණු
  උදා : මත්පැන්

- අලි ෆර්උ - උපමාව/ නව ගැටළු
  විසඳිය යුතු නව ගැටලුව. මේ සඳහා කොන්දේසි දෙකක් තිබේ.

- අල් ඉල්ලත් - සමානත්වය/ පොදු සාධකය
  කරුණු දෙකේම දක්නට ලැබෙන සමානකම හෝ පොදු සාධක
  උදා : මත්

- අල් හුකුම් - නීතිමය විනිශ්චය
  අල් අස්ලි හි විනිශ්චය අල් ෆර්උ ට ලබා දීම
  උදා : මත්පැන් වල තිබෙන මත්වීම විස්කි හා සමාන බැවින් වියද නරාම් වේ.

**(ලකුණු 04)**

Department of Examinations - Sri Lanka

(iii) කියාස් වර්ග සඳහන් කොට ඒවායින් **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

අල් ඉල්ලත් අනුව මෙය කාණ්ඩ තුනකට බෙදිය හැකිය.

1. කියාසුල් අ:ලා / අව්ලා
2. කියාසුල් මුසාවි
3. කියාසුල් අද්නා

1. කියාසුල් අ:ලා / අව්ලා
ෆර්උ හි දක්නට ලැබෙන ඉල්ලත් අස්ලි හි ඉල්ලත්නට වඩා අගයෙන් වැඩි වීම
උදා : අල්කුර්ආන් හි දෙමව්පියන්ට 'ච්' යනුවෙන් නොපසන්න යනුවෙන් පවසන විට දෙමව්පියන්ට හිංසා කිරීම මීටත් වඩා ප්‍රමාණයෙන් වැඩිය.

2. කියාසුල් මුසාවි
අස්ල් හා ෆර්උ හි දක්නට ලැබෙන පොදු සාධකයේ වටිනාකම සමානකමින් තිබීම 'කියාස් මුසාවි' වේ.
උදා : බල්ලා ලෙව කා බඳුන හත් වරක් සෝදන ලෙස හදීසියේ සඳහන් වේ. ඌරා ලෙව කා බඳුනද හත් වරක් සේදිය යුතුය.

3. කියාසුල් අද්නා
අස්ල් හි තිබෙන පොදු සාධකයෙ අගයට වඩා ෆර්උ හි දක්නට ලැබෙන පොදු සාධකය වඩා අඩු වීම.
උදා : මත්පැන්, දුම් බීම

***(කියාස් හි වර්ග තුන සඳහන් කර ඇත්නම් ලකුණු 02ක්ද ඒවායින් 02ක් පැහැදිලි කර ඇත්නම් 2 X 2 = ලකුණු 04ක්ද එකතුව ලකුණු 06ක් ලබා දෙන්න)***

(iv) කියාස් හි ප්‍රයෝජන **හතරක්** සවිස්තරාත්මකව පැහැදිලි කරන්න.

1. ඉස්ලාමීය නීති විද්‍යාවේ දියුණුවට දායක වීම
2. අළුතින් මතු වන ගැටළු විසඳීමට උපකාරී වේ.
3. නිරන්තරයෙන් මතුවන ප්‍රශ්නවලට විසඳුම් සෙවිය හැකිය යන අදහස තහවුරු කරයි.
4. ඉස්ලාමයේ ගාමක බලවේගය පවත්වා ගැනීමට මග සැලසීම

***(මෙවැනි ප්‍රයෝජන 04ක් සඳහන් කර ඇත්නම් ලකුණු 04ක්ද එයින් 4ක් විග්‍රහ කල ඇත්නම් 4 X 2 = ලකුණු 08ක්ද ලබා දෙන්න)***



Department of Examinations - Sri Lanka

2. (i) 'තලාක්' යන්නෙහි අර්ථය කුමක් ද?

**භාෂාමය තේරුම**

නිදහස ලැබීම, දික්කසාදය, අත්හැරීම

**ඉස්ලාමීය භාෂාමය තේරුම**

පිරිමින්ට ලබා දී ඇති දික්කසාද වීමේ අයිතිය ගැන සඳහන් කරයි.

***(වචන අර්ථ දැක්වීමට 01 ලකුණකද්,***

***පැහැදිලි කිරීම සඳහා 01 ලකුණකද්,***

***එකතුව ලකුණු 02ක් ලබා දෙන්න)***

(ii) තලාක් රජඉ, බාඉන් යන බෙදීම් **දෙක** පැහැදිලි කරන්න.

**1. රජඉ ( නැවතත් හිමිකර ගත හැකි)**

තලාක් රජඉ යනු නැවතත් හිමිකර ගත හැකි තලාක් වේ. විධිමත් දික්කසාදයක් අතරතුර, දික්කසාදය එක් වරක් හෝ දෙවරක් ප්‍රකාශ කරනු ලබන අතර, එම කාල සීමාව අවසායට පෙර යුවලට නැවත එකට ජීවත් විය හැකිය. මෙසේ නැවත එක්වීමට නව කොන්දේසි නොමැත.

**2. බාඉන් ( නැවතත් හිමිකර ගත නොහැකි)**

මෙය වර්ග 02කට බෙදේ.

- බාඉන් සුහ්රා (කුඩා බෙදීම)

බාඉන් සුහ්රා යනු විධිමත් දික්කසාදයේ දී තුන්වන තලාක් කියවීමට පෙර 'ඉද්දා' කාල සීමාව අවසන් වුවහොත් නව විවාහ ගිවිසුමක් යටතේ එම යුවළ නැවත එකට ජීවත් වීමට අවසරය හිමි අවස්ථාව වේ.

- බාඉන් කුබ්රා (මහා බෙදීම)

මෙය තලාක් තුනම ප්‍රකාශ කර අවසන් කර ඇති මහා බෙදීමකි. මෙයින් පසු මෙම යුවළට විවාහයෙන් එකට ජීවත් වීමට අවශ්‍ය නම් එයට අවශ්‍ය මග පෙන්වීම අල්කුර්ආන් පැහැදිලි කරයි.

එම කාන්තාවගේ ඉද්දා කාලය අවසන් වූවාට පසු ඇය වෙනත් පුරුෂයෙකු හා විවාහ වී ඔහු සමග පවුල් ජීවිතය ගත කර එම ස්වාමිපුරුෂයා විසින් දික්කසාද විය යුතුය හෝ එම (පසු) ස්වාමිපුරුෂයාගේ මරණයෙන් පසු නැවත තමාගේ ඉද්දා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු නව ගිවිසුම හරහා දික්කසාද වූ ස්වාමිපුරුෂයා සමග ජීවත් විය හැකිය.

***(මෙවැනි විග්‍රහ ලියා ඇත්නම් ලකුණු 04ක් ලබා දෙන්න)***

Department of Examinations - Sri Lanka

(iii) 'ඉද්දා' යන්න අර්ථ දක්වා එහි වර්ග **දෙකක්** සඳහන් කොට විස්තර කරන්න.

හැඳින්වීම : ඉද්දා යනු 'අද්ද' යන ක්‍රියා පදයෙන් දිස් විය.

භාෂාමය තේරුම : ගණන් කිරීම

පරිභාෂාමය තේරුම : සැමියාගේ වියෝව හෝ වෙන්වීම වෙනුවෙන් බිරිඳ කිසියම් කාලයක් විවාහ නොවී සිටීම.

ඉද්දා අනුගමනය කරන කාන්තාවන් අනුව එහි වර්ග තීරණය වේ.

1. සැමියාගේ අභාවය වෙනුවෙන් අනුගමනය කරන ඉද්දා :

   මාස 04යි දවස් 10යි - (2:234)

2. තලාක් පවසනු ලැබූ කාන්තාවන්ගේ ඉද්දා :

   ඔවුන්ගේ ඉද්දා හි කාල අවකාශය කුර්උ 03ක් ය. (2:228)

   තලාක් පවසනු ලැබූ මාසු ශුද්ධිය (හෛල්) ඇති නුවුවා අය ද මාස් ශුද්ධිය නැවතුණු වයෝවෘද්ධ අය. මොවුන්ගේ ඉද්දා කාල සීමාව මාස 03කි. (අත්තලාක් :4)

3. ගැබිණි කාන්තාවන්ගේ ඉද්දා :

   මේ අයගේ සැමියා අභාවය වූවත් නැතිනම් ඔවුන් විසින් දික්කසාද කර ඇති නම් ඔවුන්ගේ ඉද්දා කාල සීමාව දරුවා ප්‍රසූත කරන තෙක් වන්නේය. (අත්තලාක් :4)

   එම දරුවා අඩු මාස දරු උපත වූවද එයද අදාලය.

***(ඉද්දා යනු අර්ථ දැක්වීමට ලකුණු 02ක්ද***
***එහි වර්ග 02ක් සඳහන් කර විග්‍රහ කර ඇත්නම් 2 X 2 = ලකුණු 04ක්ද***
***මුළු ලකුණු 06ක් ලබා දෙන්න)***

(iv) ඉද්දා හි අරමුණු **හතරක්** සවිස්තරාත්මකව පැහැදිලි කරන්න.

- දෙවියන්ගේ ආඥාව පිළිගෙන එය ඉටු කිරීම
- මානසික පීඩනයන්ගෙන් මිදීමට ඇති මාර්ගය
- පළමු සැමියා මගින් ගැබ් ගෙන ඇත්දැයි නිරීක්ෂණය සඳහා වන කාලය
- සැමියා වියෝ වූ කාන්තාව ඔහුගේ වියෝව අනුස්මරණය කිරීම සඳහා කාල සීමාව
- නැවත විවාහ වීම සම්බන්ධව තීරණයකට එළැඹීමට ඇති කාල සීමාව
- තලාක් රජ්ඉ වූවා නම් නැවත එක්ව ජීවත් වීමට අවස්ථාවක් ලබා ගැනීම. (තමාගේ අඩුපාඩු හදා ගැනීමට අවස්ථාවක් උදා කර ගැනීම තුලින් නැවත එක් වී ජීවත් වීම)
- දරුවකුගේ බහුවිධ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා
  (උදා : පියා, පසු උරුමය, මහිරම් - අරනබ් නිරාවර්තනය)

**(ලකුණු 08)**

Department of Examinations - Sri Lanka

**3.** (i) ඉස්ලාමික බැංකු ක්‍රමය අර්ථ දක්වන්න.

ඉස්ලාමීය බැංකුකරණය යනු ඉස්ලාමීය ආර්ථික සීමාවන් පවත්වා ගනිමින් පොළිය මගහැර සමාජ සුබ සාධනය මත පදනම්ව ජනතාව අතර ගණු දෙණුව පහසු කිරීම අරමුණු කරගත් සංවිධානයකි/ සමාගමකි.

***(අර්ථ කථනයට ලකුණු 02ක් ලබා දෙන්න)***

(ii) ඉස්ලාමික බැංකු ක්‍රමයේ මූලධර්ම **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- පොලිය හා සම්බන්ධ සියළුම ක්‍රියාවන් සහමුලින්ම බැහැර කිරීම
- ධනය රැස් කිරීමේදී ධනය පමණක් නොව කෙනෙකුගේ ශාරීරික හා මානසික ශ්‍රමය ආත්ම විශ්වාසය යනාදිය ආයෝජන ලෙස සලකනු ලැබේ.
- ආර්ථික සංවර්ධනය සමඟ සමාජීය සංවර්ධනය සම්බන්ධ කිරීම
- ධනය හුවමාරු කිරීම
- නිෂ්පාදන හැකියාව වර්ධනය කිරීම
- ප්‍රාග්ධන වර්ධන හැකියාව තවහුරු කිරීම
- ඉස්ලාමීය සමාජ හා ජන ජීවිතයටත් අන්‍යොන්‍ය උපහාරයටත් මඟ සලස්වා දෙන අතර සමාජය තුල යුක්තිය හා සාධාරණව සම්පත් බෙදී යාමෙන් සැලැස්වීම
- ෂරිආ නීතියට අනුගත වෘත්තිය අංශයක් හා ආයෝජන ක්‍රම හඳුන්වා දීම
- බැංකු ක්‍රියාකාරිත්වය ෂරිආ නීතියට අනුගතව පවත්වා ගෙන යාම

***(මෙයින් මූලධර්ම 04ක් පමණක් ලියා ඇත්නම් ½ X 4 = ලකුණු 02ක්ද,***
***මෙයින් මූලධර්ම 04ක් විග්‍රහ කර ඇත්නම් 1 X 4 = ලකුණු 04ක් ලබා දෙන්න.)***

(iii) මුආමලාත් සම්බන්ධ වූ ඉස්ලාමික සදාචාරාත්මක අගයන් **හතරක්** සඳහන් කොට ඉන් **දෙකක්** ගැන පැහැදිලි කරන්න.

1. **සත්‍ය පැවසීම**

   'අත්තාජිරුස් සදූක්' යනු නබි (සල්) පැවසූහ. 'අවංක ව්‍යාපාරිකයා කියාමත් දිනයේදී නබිවරුන්, සත්පුරුෂයින් හා ෂහීද්වරුන් සමග සිටින්නේය' - (තිර්මිදි)

2. **විශ්වාසභාවය**

   ඔවුහු තම අමානතයන් සහ තමන්ගේ පොරොන්දු අවංකව ඉටු කරන අයද වෙති. (අල්.මු:මිනූන් :08)

3. **අවංකභාවය**

   දහම යනු අවංකව කටයුතු කිරීම වේ. (මුස්ලිම්)

Department of Examinations - Sri Lanka

4. **යුක්ති සහගත වීම**
   මිනුම් කිරුම් සාධාරණ ලෙස ඉටු කරණු (අල් අන්ආම් : 152)

5. **පරෝපකාරී වීම**
   පරෝපකාරී තැනැත්තා අල්ලාහ්ගේ දායාදයට භාජනය වනු ඇත. ඔහු ගණුදෙනුවේදී පරෝපකාරීව හැසිරෙයි. (බුහාරි)

6. **අයිතීන් සුරකීම**
   'නුඹලාගෙන් කෙනෙකු තම සහෝදරයාගේ ව්‍යාපාරයට විරුද්ධව ව්‍යාපාර නොකරන්න' (බුහාරි)

7. **සීමා රහිත සදකව**
   ව්‍යාපාරිකයිනි! නියත වශයෙන්ම ව්‍යාපාරය මුසාවාදය හා සීමාව උල්ලංඝනය යනාදිය සහිතය. එබැවින් එයින් මිදීමට සදකා දෙන්න. (අබුදාවුද්)

**(ලකුණු 06)**

(iv) බෛයිතුල් මාල් පරිපාලනය සම්බන්ධව කලීෆාවරු අනුගමනය කළ ක්‍රියා **හතරක්** හඳුනාගෙන විස්තර කරන්න.

- බෛයිතුල් මාල් යනු ඉස්ලාමීය රටේ පවත්වෙන රාජ්‍ය භාණ්ඩගාරය වේ.
- බෛයිතුල් මාල් යනු නම උමර් (රලි) තුමාගේ කාලයේ දී හඳුන්වන ලදි.
- බෛයිතුල් මාල් පරිපාලනය සම්බන්ධව කලීෆාවරු අනුගමනය කළ ක්‍රියාවල්
- උමර් (රලි)
  - ඒ සඳහා වෙනම ආරක්ෂිත ගොඩනැගිලි ඉදි කලේය.
  - බෛයිතුල් මාල් හි වසරකට ලැබෙන ආදායම් එම වසර තුලම වියදම් කරන ලෙස නියෝග කළේය.
  - අම්මාර් බින් යාසිර් (රලි) තුමාව කූෆාහි ආන්ඩුකාරවරයා ලෙස පත් කරන විටම, ඔහුට බෛයිතුල් මාල් සම්බන්ධව උපදේශකවරයා හා අමාත්‍යවරයා ලෙස අබ්දුල්ලාහ් ඉබ්නු මස්උද් (රලි) පත් කිරීම.
- අලි (රලි)
  - සතියක් තුල ලැබෙන ආදායම් ඒ සතිය තුලම වියදම් කිරීමට නියෝග කළේය.
  - බෛයිතුල් මාල් වල එකතුව කුමන අරමුණක් සඳහා යෙදිය යුතුද යන්න දැක්වීමට මාර්ගෝපදේශකයන් ලෙස නීති විශාරදයන් පත් කරන ලදි.

***(මෙවැනි කරුණු 04ක් ලියා ඇත්නම් 4 X 1 = ලකුණු 04ක්ද කරුණු 04ක් සඳහන් කර එය විග්‍රහ කර ඇත්නම් 4 X 2 = ලකුණු 08ක්ද ලබා දෙන්න)***

Department of Examinations - Sri Lanka

## II කොටස

4. (i) ඉස්ලාමීහි සමාජ ජීවිතයෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

- සමාජ විද්‍යාඥයින් ඔහුව සමාජ සත්වයා යයි පවසයි.
- ඉස්ලාම් ඔහුව අල්ලාහ්ගේ නියෝජිතයා යැයි උසස් කර සඳහන් කරයි.
- සෑම ජීවියෙකුට මෙන්ම මිනිසාට ද අවශ්‍යතා ඇත්තේය.
- ප්‍රඥාව ඇත්තෙකු වීම අනුව ද අල්ලාහ්ගේ නියෝජිතයා වීම අනුවද මිනිසාගේ අවශ්‍යතාවයෙන් සීමා රහිතය. ඒ සියලුම අවශ්‍යතා මිනිසාට තනිව සිට ලබා ගත නොහැක.
- කුසගින්න, පිපාසය, ලිංගික ආශා වැනි ශාරීරික අවශ්‍යතාවයද ආදරය, ආරක්ෂාව, ගරු කිරීම වැනි මනෝ විද්‍යාත්මක අවශ්‍යතාවයන්ද ප්‍රවාහන, අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම වැනි සමාජ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට අන් අයගේ උදව් අවශ්‍යය.
- මිනිසා, එකට ජීවත් වීම මගින් ලොවෙහි සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයෙන් බිහිවෙයි.
- නබි තුමාගේ ජීවිතය තුලින් සමාජ ජීවිතයෙහි වැදගත්කම එළි දක්වයි.
- මක්කා ජීවිත කාලයේදී තනි පුද්ගලයින්ව නිර්මාණයද මදීනා ජීවිත කාලය තුලදී තනි පුද්ගලයන් යොදාගෙන සමාජයක් ද නිර්මාණය කළේය.
- තනි පුද්ගලයන් අතර තිබෙන පොදු ලක්ෂණ එය තුලින් එකිනෙකා සම්බන්ධ කරන්නා වූ නායකත්වය, ස්වාධීනව ක්‍රියා කළ හැකි ප්‍රදේශය යනු සමාජය නිර්මාණය වීමට සාධකයයන් වේ.
- නබි (සල්) තුමා එම සමාජය සැලසුම් සහිතව ගොඩ නැගූහ.
- ඉන් පසු මුස්අබ් ඉබ්නු උමෛර් (රලි) මදීනාවට යවා ඉස්ලාමය ප්‍රචාරය කළ විට ප්‍රදේශයේ වාතාවරණය ද නිරීක්ෂණය කරවූහ.
- දෙවැනි අකබා ප්‍රතිඥාවෙහි දී නබි (සල්) තුමාගේ නායකත්වය පිළි අරගෙන එතුමාණන්ව ආරක්ෂා කිරීමේ සහතිකය ලබා ගත්තේය.
- අවසානයේ දී මදීනාවට හිජ්රත් ගිය පසු මස්ජිදුන් නබවි නිර්මාණය කිරීම තුළින් එම සමාජය එක් කිරීමටද හැකි විය.
- ඒ විතරක් නොව සමාජය බිහි කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක උපුටා ගනිමින් සමාජය ගොඩ නැගීමට අවු. 10ක් සැලසුම් ගතව ක්‍රියා කළහ.
- ඉස්ලාම් දහමය ජීවිතයේදී ක්‍රියාකරන විට අඩු පාඩු ඇති විය හැකිය. එය නිවැරදි කිරීමේ අවස්ථාව සමාජ ජීවිතය තුලින් හැකිවේ.
- නබි තුමාගේ අභාවයෙන් පසු ඇති වූ ඇතැම් ප්‍රශ්නවල දී තනි පුද්ගලයන් නිසි නායකත්වය ලබා දීම එතුමාගේ සමාජ නිර්මාණය මෙයින් දක්නට ලැබේ.

**(ලකුණු 10)**

(ii) ඉස්ලාමික සමාජ සංවිධානයෙහි විශේෂාංග අතුරෙන් සමානාත්මතාවය හා සහෝදරත්වය ගැන විස්තර කරන්න. ((

- සමානාත්මතාවය යනු 'අල්ලාහ් ඉදිරියේ සියලු දෙනාම සමානයි යන අදහස ගත යුතුය.' (ආචාර්ය හමුදා අබ්දුල් අතී)
- අල්කුර්ආන් හා අස්සුන්නා මෙය පැහැදිලිව ඉදිරිපත් කරයි.



Department of Examinations - Sri Lanka

- ඉස්ලාම් මුළු මිනිස් සමාජයම එක දෙමව්පියන්ගේ දරුවන් ලෙස හඳුන්වයි. අපි යම් හේතු මත වෙනස් වී බෙදී සිටියත්

  ජනයනි! නිශ්චය වශයෙන්ම අප ඔබලාව එක් පිරිමියෙකුගෙන් හා එක් ස්ත්‍රියකගෙන් මැව්වෙමු. (49:13)
- ජාති, භාෂා, වර්ණ හා ප්‍රදේශය යන භේදයක් සැලකිල්ලට නොගෙන සියලු දෙනාම සමානාත්මතාවයෙන් සැලකිය යුතු බව ඉස්ලාම් පවසයි.
- නබි තුමා 'හජ්ජතුල් විදා' දේශනාවේදි

  ජනයනි ඔබගේ දෙවියන් එක්කෙනකි ඔබගේ ආදි පියා ආදම්ය. ඔබ සියල්ලෝම ආදම්ගේ පරම්පරාව වේ. ආදම් පස්වලින් මවන ලදි. දැනගන්න! අරාබි ජාතිකයෙකු අරාබි නොවන්නකු මත හෝ අරාබි නොවන්නෙකු අරාබි ජාතිකයෙකු මත හෝ සුදු ජාතිකයෙකු කළු ජාතිකයෙකු මත හෝ කළු ජාතිකයෙකු සුදු ජාතිකයෙකු මත හෝ ඕනෑම ආකාරයක ගරුත්වයක් හෝ විශේෂත්වයක් හෝ නොමැත.
- අබුදර් (රලි), පිලාල් (රලි) ව කළු ජාතික පුතු ලෙස ආමන්ත්‍රණය කරන විට නබි තුමා අවවාද කිරීම
- අවුරුදු 23ක නබිතුමාගේ සමාජ නිර්මාණයේදී සල්මාන් පාරිස් (රලි), සුහයිබ් අර්රූම් (රලි), බිලාල් හබසි (රලි) එකම වේදිකාවේ සිටීම.
- ඉස්ලාම් කියා දෙන සමානාත්මතාවය මුස්ලිම්වරයෙකුගේ එදිනෙදා, සතියේ, මාස්පතා ජීවිතයේදීත් ක්‍රියා කිරීම ගැන අවධානය කරයි.

  උදා : සලාතය, හජ්
- ඉස්ලාමීය ඉතිහාසයේ පමණක් යුක්තිය ඉටු වී ඇත. එනම් ඉස්ලාමීය අධිකරණයේ කලීෆා සහ අපරාධකරුව ඉදිරිපත් වී විනිශ්චය ලබා දී ඇත.
- . මස්ජිදුන් නබවි නිර්මාණය කිරීමේදී නබි තුමා කායිකව මහන්සි වී ක්‍රියා කරමින්, සමාජය ගොඩ නැගීමේදී නායකවරයෙකුගේ ලක්ෂණය මනාව පැහැදිලි කර ඇත.

**සහෝදරත්වය**

- ඉස්ලාමීය සහෝදරත්වය ප්‍රතිපත්ති හා සම්බන්ධ වූවකි. එක් මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුගේ සහෝදරයා වෙයි. ඔහු අනෙකාට අපරාධයක් නොකරයි. (බුහාරි)
- නබි තුමා සහෝදරත්වය ඊමාන් සමග සම්බන්ධ කර මෙසේ පවසයි. 'ඉස්ලාමීය සමාජය සහෝදරත්වය මත ගොඩනැගු සමාජයකි. එම නිසා නබි තුමා මදිනාවිට ගිය විටම තම සහයන් අතර සහෝදරත්වයේ බැඳීම ශක්තිමත් කළේය.'
- මෙම සහෝදරත්වය වර්ධනය කිරීම පිණිස මුස්ලිම් වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුට කළ යුතු යුතුකම් 06ක් නබි තුමා කියා දුන්නේය.
- සකාත්, සදකා, තෑගි දීම යන ක්‍රියාවන් සහෝදරත්වය ගොඩ නැගීමේ මාර්ගයක් ලෙස නබි තුමා සඳහන් කරයි.
- සත්‍ය වශයෙන්ම ඔබ සියළු දෙනාම සහෝදරන්ය එම නිසා ඔබගේ සහෝදරයන් දෙපල අතර එකඟතාවය ඇති කරන්න. (49:10) යනුවෙන් අල් - කුර්ආන් පවසයි.



Department of Examinations - Sri Lanka

- දවස් 03කට වඩා මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකු සමග තරහ නොවිය යුතුය. (බුහාරි, මුස්ලිම්)
- මිත්‍රත්වය ලෞකික අරමුණු සඳහා නොව අල්ලාහ් වෙනුවෙන් විය යුතුය යන අදහස අවධාරණය කරයි.

  'අල්ලාහ් වෙනුවෙන් මිත්‍ර වන්න. ඔහු වෙනුවෙන්ම වෛර කරන්න' (අහ්මද්)

***(මාතෘකා දෙකම කේන්ද්‍ර කරගෙන කරුණු 05 විග්‍රහ කර ලියා ඇත්නම් 5 X 2 = ලකුණු 10කි)***

5. (i) ඉස්ලාමිහි උගන්වන මානව හිමිකම් **පහක්** හඳුනාගෙන පැහැදිලි කරන්න.

1. **ජීවත් වීමේ අයිතිවාසිකම්**

   දරිද්‍රතාව හේතුවෙන් ඔබේ දරුවන් ඝාතනය නොකරන්න. (17:31)

   ෂිර්කයට අනතුරුව මහා පාපය වශයෙන් මෙය හැඳින් වේ.

2. **ජීවිතය රැක ගැනීමේ අයිතිවාසිකම්**

   යම්කිසි කෙනෙකු වෙනත් කෙනෙකුව අසාධාරණ ලෙස ඝාතනය කරන්නේද ඔහු සියළුම මිනිසුන් ඝාතනය කලාට සමාන වේ. (5:32)

   මෙයින් ලෙඩ රෝග, තුවාල, කුසගින්න හා ජලයේ ගිලීම යනාදී මරණයට හේතුවන කරුණු වලින් රැක ගැනීමද අදහස් වේ.

3. **පතිවත රැක ගැනීමේ අයිතිවාසිකම**

   (විශ්වාසිකයිනි) ඔබ ගණිකා වෘත්තියට සමීප ද නොවන්න. (17:32)

   නබි තුමා 'හජ්ජතුල් විදා' හි ජීවිතය, දේපළ හා පතිවත රැක ගැනීම සම්බන්ධව අවධාරණය කළේය.

4. **මූලික ජීවන තත්වය ඇතිකර ගැනීමේ අයිතිවාසිකම**

   ඔවුන්ගේ ධනයෙන් සිගමන් යදින්නන්ට හා නොයදින්නන්ට කොටසක් තිබේ. (5:19)

   මිනිසාගේ මූලික අයිතිවාසිකම් වන ආහාර, ඇඳුම්, නිවාස, වෛද්‍ය ප්‍රතිකාර, අධ්‍යාපනය ලබා ගැනීමට අයිතිය ඇත. එය ලබා දීමට කිසිවෙකු නොමැති නම් එම වගකීම රජයට පැවරේ.

5. **සමානාත්මතා අයිතිවාසිකම**

   මිනිසුන් නියතවශයෙන්ම අපි ඔබලා පිරිමියෙකු හා ගැහැණියෙකුගෙන් නිර්මාණය කළෙමු. (49:13)

   කිසිඳු අරාබියක් අජම්වරයෙකුට වඩා උසස් නොවේ. කිසිඳු අජම්වරයෙක් අරාබිවරයෙකුට වඩා උසස් නොවේ. ආදම් මවනු ලැබුවේ පස්වලිනි. (බයිහකි)

6. **පෞද්ගලික (කේවගල) අයිතිවාසිකම්**

   මිනිසුන් තුන්දෙනෙකුට එරෙහිව මම පරලොව් හි වාද කරමි. ඔවුන්ගෙන් එක්කෙනෙක් මිනිසුන් වහල් කොට, විකුණා, එම මුදලින් යැපෙන්නා බව නබි තුමා පවසයි. මිනිසුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන ලෙස ඉස්ලාම් අණ කරයි.



Department of Examinations - Sri Lanka

7. **යුක්තිය ඉල්ලා සිටීමේ අයිතිවාසිකම**

විශ්වාසිකයිනි! යුක්තිය ස්ථාපිත කිරීමේදී අල්ලාහ් වෙනුවෙන් ඔබ දැඩි සාක්ෂිකරුවන් වන්න. මිනිසුන්ගෙන් එක් පිරිසක් කෙරෙහි ඇති ද්වේශ කෘරකම් කරන්නට පොළඹවන්නන් නොවිය යුතුය.

8. **මානව ගරුත්වය ආරක්ෂා කිරීමේ අයිතිවාසිකම**

විශ්වාසිකයිනි! කිසිඳු පිරිමියෙකු අන් කිසිඳු පිරිමියෙකුට සරදම් නොකරන්න. ඔවුන් (සරදම් කරන) මොවුන්ට වඩා උසස්වන්නට පුළුවනි. (එමෙන්ම) කිසිඳු ගැහැණියෙකු අන් කිසිඳු ගැහැණියෙකුට සරදම් නොකරන්න. ඔවුන් (සරදම් කරන) මොවුන්ට වඩා උසස්වන්නට පුළුවන්. (49:11)

9. **පෞද්ගලික ජීවිතයේ ගරුත්වය ආරක්ෂා කිරීමේ අයිතිවාසිකම**

විශ්වාසිකයිනි! සැක සංකාවලන් බොහෝ විට ඔබ වලකින්න. මන්ද යත් ඇතැම් කරුණු වලදී සැක කිරීම අකුසලයකි. (කිසිවෙකුගේ සැක) ඔබ හාරා විමසීමෙන් බැහැර වන්න.

10. **අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම**

මොවුන්ට අප විසින් පාලන බලය ලබා දුන් කල්හි යහපතට අණවති. අයහපත් දේ වලින් වළක්වති. (22:41)

11. **වත් පිළිවෙත් ඉටු කිරීමේ අයිතිවාසිකම**

(ඉස්ලාම්) ආගමෙහි බල කිරීමක් නැත. මංමුලාවෙන් නිසි මාර්ගය පැහැදිලි විය. (2:256)

12. **දුෂ්ට පාලනයට එරෙහිව සටන් වැදීමේ අයිතිවාසිකම**

අසාධාරණයට ලක් වූවන් හැර අන් කිසිවෙකු කිසිඳු කෙනෙකුට ප්‍රසිද්ධියේ නරක වචනවලින් කෑමොර දීමේ ක්‍රියාව අල්ලාහ් ප්‍රිය නොකරන්නේය. (4:148)

13. **දේශපාලන කටයුතුවලට සහභාගී වීමේ අයිතිවාසිකම**

'ඔවුන්ගේ සෑම කටයුත්තක්ම තමන් තුළ සාකච්ඡා කර ගනිති' (24:55)

***(මෙවැනි කරුණු 05ක් විග්‍රහ කර ඇත්නම් 5 X 2 = ලකුණු 10)***

(ii) මුස්ලිම්වරයෙකුගේ ජීවිතය සකස් කිරීමට මස්ජිදය දරන කාර්යභාරය විස්තර කරන්න.

- මස්ජිදය අධ්‍යාත්මික, අධ්‍යාපනය, ආර්ථික, සෞඛ්‍ය, සංස්කෘතික, විනය වැනි ක්ෂේත්‍ර රැසක් සහිත විනයගරුක සමාජයක් මෙහෙය වීමට පෞරුෂයක් ඇති පුද්ගලයන් බිහි කරයි.
- සතිපතා, වාර්ෂිකව විශේෂ ඉගැන්වීම් හරහා මු'මින්වරයෙකුගේ සදාචාරාත්මක ජීවිතය නියාමනය කරයි.
- මුස්ලිම්වරයෙකු අදාන් ඇමතුමට පිළිතුරු දීමෙන් කාල කළමනාකරණයට පුහුණු ලැබේ.

Department of Examinations - Sri Lanka

- මස්ජිද් කාරක සභාව මගින් එම ගමේ මුස්ලිම්වරුන්ගේ ක්‍රියා කලාපය අවධානය කොට එයින් වැරදි සිදු වුවහොත් එය ප්‍රතිසංස්කරණය කිරීම.
- මුස්ලිම්වරයෙකුගේ ඊමාන් ශක්තිමත් වීමට මස්ජිදය හේතු සාධකය (තිර්මිදි)
- මස්ජිදය මුස්ලිම්වරයෙකුට ස්වර්ග ජීවිතයක් සඳහා උනන්දුවක් ඇති කරයි.
  - ➢ මහ්සර්හි අල්ලාහ්ගේ සෙවනැල්ල ලැබෙන හත් දෙනා අතරින් මස්ජිදය අතර සමීප සබඳතා පැවැත්වූ අය ද වූහ. (බුහාරි)
- නායකත්ව පුහුණුව ලබා දී ඔහු ශක්තිමත් කරයි.
  - ➢ නබි තුමාගේ කාලයේ දී මස්ජිද් විසින් සහාබිවරුන්ට කායික හා මානසික පුහුණු ලබා ගත්තෝය.
- අන් අයගේ දුක නැති කිරීමේ ආකල්පය වර්ධනය කිරීමට මස්ජිදය උපකාරී වේ.
- මස්ජිදයේ පවත්වන අල්කුර්ආන් මද්රසා හරහා කුඩා කල සිටම දරුවන් පුහුණු ලබන හෙයිනි. එය තුළින් පුද්ගල සංවර්ධනයට අඩිතාලම ලැබේ.
- දේවබියන් හා දේව සබඳතාවයෙන් කෙනෙකුට ජීවත් වීමට මස්ජිද් මග පෙන්වයි.
- මස්ජිදයේ සිදුවෙන සාමූහික ක්‍රියාකාරකම් තුලින් (සකාත්, උල්හියා ෆිත්රා) මුස්ලිම්වරුන් අතර සමගියෙන් ජීවත් වීමේ ආකල්පය ගොඩ නැගේ.
- දිළිදුකම පිටුදැකීමේ ක්‍රියාකාරකම් තුලින් මිනිසාගේ දුෂ්ට ක්‍රියාවන්ගෙන් (සොරකම, සූරාකෑම) ඈත්වීමට මුස්ලිම්වරයෙකුව නියාමනය කිරීම.
- මස්ජිදය මධ්‍යම කේන්ද්‍රස්ථානයක් ලෙස සේවය කරන අතර ඒ තුලින් මුස්ලිම්වරයෙකුගේ භෞතික අවශ්‍යතා සපුරා ඔහුට යහපත් ජීවිතයක් ගත කිරීමට මග පාදයි.

***(මෙවැනි කරුණු 05ක් විග්‍රහ කර ලියා ඇත්නම් 5 X 2 = ලකුණු 10)***

**6. (i)** ඉස්ලාමයේ ඉජ්තිහාද් දරණ වැදගත්කම අල්-කුර්ආන් සහ සුන්නා සාධක සහිතව පැහැදිලි කරන්න.

වර්තමානයේ පහත කරුණු සලකා බැලීමේ දී ඉජ්තිහාද් හි අවශ්‍යතාවය පැහැදිලි වේ.

- අල් කුර්ආන් හා අස්සුන්නා හි නීති පද වෙන්කර එය හඳුනා ගැනීමට ඉජ්තිහාද් අවශ්‍ය වේ.
- අල් කුර්ආන් හදීස් හී ඍජු විනිශ්චයකින් තොරව මතුවන නවීන ගැටළු විසඳීමට
- නීති රීති පදවලින් නීති රීති පැනවීමට අදාල පද දැන ගැනීමට
- බහු විධ අදහස්වලට යටත්වන පද වලින් වඩාත් සුදුසු පදය තෝරා ගැනීමට
- කලින් කලට මතුවන ආගමික, සමාජීය, දේශපාලන හා ආර්ථිකමය වෙනස්කම් සහ මානව චින්තනයේ වර්දනය නිසා ඇතිවන නව ගැටළු පිළිබඳව ඉස්ලාම් දහමේ ස්ථාවරය පැහැදිලි කිරීම.
- නූතන මුස්ලිම් සමාජය බලාපොරොත්තුවෙන් සිටින ප්‍රතිසංස්කරණ රැගෙන යාමට.
- සමකාලීන විද්‍යාත්මක ප්‍රගතිය හා සමාජ අභිවෘද්ධිය නිසා ඇති වන නවීන ගැටළුවලට ඉස්ලාම් දහමේ විසඳුම ලබා ගැනීම (test tube baby)
- ඉස්ලාම් හි හලාල් හා හාරම් පැහැදිලිය. මේ දෙකටම ඇතුලත් නොවන දේ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට.



Department of Examinations - Sri Lanka

- ඉස්ලාමයේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ.
- මුස්ලිම්වරුන් සුළුතරයක් වෙසෙන රටවල, ප්‍රදේශවල ගැටළුවට විසඳුම් ලබා ගැනීමට.

මේ සඳහා වන අල් කුර්ආන් නිදසුන් :

ඔවුන් සැම කටයුත්තක්ම තමන් තුල සාකච්ඡා කර ගනියි. (24:55) සහ (4:83)

හදීස් නිදසුන් :

- මගේ සමාජය නොමග යාමෙන් නොඑකඟ වෙයි. (තිර්මිදි)
- ඉජ්තිහාද් කිරීමේදී (එම විද්වතා) නිවැරදි තීරණයක් ලැබුණහොත් ඔහුට ප්‍රතිලාභ/කුසල් දෙකක් ඇති අතර, එය වැරදි නම් ඔහුට එක් ප්‍රතිලාභ/කුසල් ඇත. (බුහාරි)

***(මෙවැනි කරුණු 05ක් අල් කුර්ආන් අල්හදීත් නිදසුන් සමග විග්‍රහ කර ලියා ඇත්නම් 5 X 2 = ලකුණු 10)***

(ii) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ජීවන ඉතිහාසය කෙටියෙන් සඳහන් කොට ෆික්හ් ක්ෂේත්‍රයේ වර්ධනයට සිදුකළ දායකත්වය විස්තර කරන්න.

- සම්පූර්ණ නම : අබූ අබ්දුල්ලා අහ්මද් ඉබ්නු මුහම්මද් හන්බල්
- උපත : හිජ්රි 164 බක්දාද්හි
- විපත :හිජ්රි 241
- මෙතුමාගේ කාලයේදී තෆ්සීර්, හදීස්, ෆික්හ්, භාෂා, අරාබි සාහිත්‍යය වැනි අංශ දියුණු විය.
- අහ්ලුර් රයි අහ්ලුල් හදීස් යනු කරුණු දෙකම අනුගමනය කරමින් ෂරීආව ඉගෙන ගත්තේය.
- එතුමාගේ ගුරුවරුන් : ඉබ්‍රාහිම් ඉබ්නු සඅද්, ඉමාම් යූසුෆ්, ඉමාම් ෂාෆි, සුෆ්යාන් ඉබ්නු උයයිනා
- මුඃතසිලා සංකල්පය පිළිගැනීම ප්‍රතික්ෂේප කල නිසා කලීෆා මාමූන් විසින් වදහිංසාවට ලක් වූහ. මෙම නිසා 'ඉමාමුල් මුම්තහන්' යන ඔහු ආමන්ත්‍රණය වෙයි.

**ෆික්හ් ක්ෂේත්‍රයෙහි එතුමාගේ දායකත්වය**

- සම කාලයම මුහද්දිස් හා ෆකීහ් හැටියට සේවය කළේය.
- එතුමා ෆික්හ් ක්ෂේත්‍රයෙහි කලින් සිටි ඉස්ලාමීය විද්වතුන්ව අනුගමනය කළේය.
- එතුමාගේ නීති මූලාශ්‍රයන් - අල් කුර්ආන්, අස්සුන්නා, සහභාගීවරුන්ගේ ඉජ්මා, සහභාගීවරුන්ගේ මත, කියාස්
- ඉමාම් විසින් නීතිමය ගැටළු විශාල ප්‍රමාණයක් පැහැදිලි කර ඇත. එය හැටදාහක් බව පැවසේ.
- ලොවපුරා සිටින දස දහස් ගණනින් ජනතාව ඔහු වෙත පැමිණ පුළුල් පරාසයක කරුණු සම්බන්ධයෙන් නීතිමය තීන්දු ලබා ගෙන ඇත.
- ඉමාම්ගේ නීතිමය තීන්දු පදනම් වූයේ හදීස් සහ නිර්මල ඉස්ලාමීය විද්වතුන්ගේ අදහස් මතය.
- ඉමාම්ගේ අදහස් ලොවට ලබා දුන්නේ ඔහුගේ ශිෂ්‍ය අබූ බක්ර් අල් කලාම්ගේ උත්සාහයෙනි.

Department of Examinations - Sri Lanka

- ➢ මෙතුමාගේ චින්තනය හා සිතුවිලි එතුමාගේ පුත් සාලිහ් හා අබ්දුල්ලා විසින් සම්පාදනය විය. එය 'මසාඉල් සාලිහ්' සහ 'මුස්නද්' යනුවෙන් හැඳින්වේ.
- ➢ කිතාබුස් සුනන් ඔහුගේ ග්‍රන්ථයකි.
- ➢ මෙතුමාගේ සිතුවිලි 'හන්බ ලි මද්හබ්' හැටියට ගොඩනැගුණේය.

***(ජීවන ඉතිහාසය සම්බන්ධව කරුණු 05ක්ද ෆික්හ් ක්ෂේත්‍ර දායකත්වයන් 05ක් ද විග්‍රහ කර ලියා ඇත්නම් 1 X 2 = ලකුණු 10)***

7. (i) ශ්‍රී ලංකා ඉතිහාසයේ සිංහල රජවරු මුස්ලිම් සමාජය හා පවත්වාගෙන ගිය මිත්‍රශීලී සබඳතාවන් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

**රජවරු සමග මිත්‍රත්වය හා සබඳතා**

- රජවරු මුස්ලිම්වරුන් සමග මිත්‍රත්වය පැවැත්වූහ.
  රජතුමාගේ අනුග්‍රහය ඇතිව අපනයන වෙළඳාමේ මුස්ලිම්වරුන් නිරත වූහ.

- රජතුමාගේ රාජ්‍ය පාලනයට මුස්ලිම්වරුන් සම්බන්ධ කර ගැනීම.

  කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සමයේ (1747-1782) සේහ් ආලිම් තැනැත්තා 'මාඩිගේ බද්දේ නිළමේ' ලෙස කටයුතු කිරීම. ඔහුට පසු ඔහුගේ මුණුබුරා 'සෙහ් අබ්දුල් කාදර් මෙම තනතුරට පත් කරන ලදි.

- වෛද්‍ය සේවයේ මුස්ලිම් වෛද්‍යවරුන් සේවය කළෝය.

  කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සමයේ 'බෙහෙත්ගේ මුහන්දිරම් නිලමේ' ලෙසද රාජ්‍ය සභා වෛද්‍යවරයා ලෙසද සේවය කල 'සේහ් මුගම්මද් මුදලි'ට 'වෛද්‍ය තිලක රාජකරුණ ගෝපාල මුදලිය' යන පවුල් නාමයෙන් ආමන්ත්‍රණය කළහ.

- රජතුමාගේ දූතයන් ලෙස සේවය කිරීම
  ක්‍රි.ව.1283 ශ්‍රී ලංකා රජු විසින් ඊජිප්තුවට යැවූ දූත පිරිසට 'අබූ උස්මාන්' යන තැනැත්තා නායකත්වය ලබා දීම.

- රජතුමාගේ රාජ්‍ය සභාවේ සේවය කිරීම
  සිංහල රජුන්ගේ රාජ්‍ය සභාවේ මුස්ලිම්වරුන් අමාත්‍යන් ලෙසත්, උපදේශකවරුන් ලෙසත් සේවය කළෝය. පොළොන්නරුව යුගයේ I වැනි විජයබාහු රජුගේ පදවි ප්‍රාප්ති උත්සවය මෙහෙයවීම 'පෙරිය තම්බි මරක්කයාර්' යන මුස්ලිම් විසින් කරන ලදි.

- සිංහල රජුගේ හමුදාවට බැඳී සේවය කළහ.
  වැල්ලවාය යුද්ධයේ දී ඔටු පංතිය - මෙම සේවය අගය කොට හඟුරන්කෙත දේවාලයට ප්‍රදානය කළ තිර රෙද්දෙහි ඔවුන්ගේ හමුදා ඇඳ තිබීම.
  ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රි.ව.1798 - 1815) සමයේ හමුදාවේ මුස්ලිම් සෙබලුන් 850ක් සිටීහ.



Department of Examinations - Sri Lanka

- රජතුමාගේ මාලිගාවේ මුස්ලිම්වරුන් මූලිකත්වය ලබා ගත්හ.
  රජතුමාට ආහාර සපයන සේවාවේ හා රාජ්‍ය නාන කාමර රාජකාරියේ මුස්ලිම්වරුන් නිරතව සිටිහ.
- ශ්‍රී ලංකාවේ හා සිංහල රාජ්‍යයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමේ අරගල සඳහා මුස්ලිම්වරු සහභාගී වීම.
  මායාදුන්න සීතාවක රාජධානිය භාරගත් සටනේ දී පෘතුගීසි සෙන්පතියා විසින් ඒ.එම්. වාප්පිච්චි මරික්කාර්, කුංජලි මරික්කාර් නම් රජුගේ වීරෝදාර සෙන්පතියන් දෙදෙනකු ඝාතනය කරන ලදි.

***(මෙවැනි කරුණු 05ක් විග්‍රහ කර ලියා ඇත්නම් 5 X 2 = ලකුණු 10)***

(ii) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය තුළ පහත ඒවායෙහි සබඳතාව පරීක්ෂා කරන්න.
 (අ) මාන්තයි වරාය
 (ආ) ඉබ්නු බතූතා

(අ) මාන්තයි වරාය

- උතුරු පළාතේ මන්නාර් දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- මෙම වරාය නගරය නැගෙනහිර හා බටහිර අතර වෙළඳාමේ කේන්ද්‍රස්ථානයක් ලෙස පිහිටා තිබේ.
- මෙම වරාය නගරය සේද මාවත (Silk rule) වෙළඳාමේ වැදගත් ස්ථානයක් ලෙස සැලකේ.
- මෙම නගරය සම්බන්ධව මහා වංශය හා දීප වංශයෙහි පුළුල්ව සඳහන් කර ඇත.
- පුරා විද්‍යාත්මක ඉතිහාසය තුල මුස්ලිම්වරුන්ගේ මුල් පැවැත්ම පිළිබඳ ඉඟි සැපයීමේදී වැදගත් කාර්යභාරයක් මෙම වරාය නගරය ඉටු කරයි.
- මෙහි සිදුකරන ලද පුරා විද්‍යාත්මක කැනීම්, අරාබි, පර්සියානු කාසි හා සෙල්ලිපිද මුස්ලිම් ජනාවාසය තිබි බවට සාක්ෂි සපයයි. (ආචාර්ය එම්.ඒ.එම්.සුක්රි)
- මාන්නයි හා ඒ අවට කැනීම් වලදී හමු වූ ක්‍රි.ව. 8 - 11 සියවස්ට අයිති මැද පෙරදිග සහ චීන මැටි බඳුන් මෙම වෙළදාමේ අරාබි හා චීන ජාතීන්ගේ භූමිකාව නිරූපණය කරයි.
- මෙම කැනීම් වලදී හමු වූ මළ සිරුරු මුස්ලිම්වරුන්ගේ මිහිදන් කිරීමේ ක්‍රමයට සමාන (කිබ්ලා දිසාවේ තක්බීර් ක්‍රමය සමග) වීම ඉපැරණි මුස්ලිම් ජනාවාස පිළිබඳ සාක්ෂියකි.

***(මෙවැනි කරුණු 05ක් සඳහන් කර ලියා ඇත්නම් 1 X 5 = ලකුණු 5)***

(අ) ඉබ්නු බතූතා

- මොහු මොරොක්කෝවේ ජාතික සංචාරකයා වේ.
- ක්‍රි.ව. 1344 දී ශ්‍රී ලංකාවට පැමිණි බව ඔහුගේ සංචාරක සටහන් සඳහන් කරයි
- ඔහුගේ සටහන් 14 වැනි සියවසේදී මුස්ලිම්වරුන් වෙරළ බඩ ආශ්‍රිතව පමණක් නොව ලංකාවේ ගම්වල්දීත් වාසය කළ බව සඳහන් කරයි.
- ශ්‍රී ලංකාවට පැමිණි ඔහු පුත්තලම සිට හලාවත, කුරුණෑගල, ගම්පොළ හරහා ශ්‍රී පාදයට ගොස් නැවත රත්නපුර, දෙවුන්දර, ගාල්ල, කොළඹ හරහා පුත්තලම බලා ගියේය.



Department of Examinations - Sri Lanka

- මෙම ගමනේදී තමා හමු වූ මුස්ලිම්වරුන් ගැනත් ඔවුන් වටා තිබූ මස්ජිත් හා ජනාවාස ගැනත් සඳහන් කර ඇත.
- තවද ගාල්ලේදී නැව් නායකයා වන 'තාහුදා ඉබ්‍රාහිම්' තැනැත්තාගේ නිවසේ දී ආහාර අනුභව කල බවත් සඳහන් කර ඇත.
- තවද කුරුණෑගලදී මස්ජිදයක් නිර්මාණය කර තිබූ බවත්, එහි නැමදුම් ඉටුකල බවත් සඳහන් කර ඇත.
- කුරුණෑගලදී 'සෙයින් සිරාසි' යන තැනැත්තා තමාගේ දරුවන් සමග ශ්‍රී පාදයට යන තැනැත්තන්ට මගපෙන්වන්නන් ලෙස ක්‍රියා කල බවත් ඔහුගේ සටහනේ සඳහන් කර ඇත.
- එම නිසා මෙතුමාගේ පැමිණීම ඉපැරණි මුස්ලිම්වරුන්ගේ ඉතිහාසයට සාක්ෂියක් ලෙස සඳහන් වේ.

***(මෙවැනි කරුණු 05ක් සඳහන් කර ලියා ඇත්නම් 1 X 5 = ලකුණු 05)***

**8.** පහත අංශ ගැන කෙටි සටහන් ලියන්න.

(i) පරලොව ඇත යන්නට සාක්ෂි

- නබි (සල්) තුමා පරලොව විශ්වාසය ගැන කතා කරන විට එය සිදුවිය නොහැක්කක් යැයි සිතූ තැනැත්තන් නබි තුමාව සමච්චල් කළෝය. ඒවාට අල් කුර්ආනය තර්කානුකූලව පිළිතුරු දුන්නේය. ඇට කටු නැවත පණ ගන්වන්නේ කවුදැයි යන්න ඇසූ විට පළමුවෙන්ම ඒවා සැදූ තැනැත්මා නැවත ඒවාට පණ/ ජීවය දෙන බව අල් කුර්ආන් පවසයි. (36:77-83)
- ඉපදීමත් මරණයත් ලද මේ ලෞකික ජීවිතය කාලයාගේ විපත යැයි තර්ක කරන අයට. එය ඔවුන්ගේ නොදැනුවත්කම බව අල් කුර්ආන් පවසයි. (45:24)
- මුලින්ම ලෝකය මැවූ අල්ලාහ්ට කිසිඳු පූර්වාදර්ශයක් නොමැතිව දෙවන වරටත් එය නිර්මාණය කිරීම ඉතා පහසුයි යනු අල් කුර්ආන් සඳහන් කරයි. (30:27-28)
- පරලොවෙහි විශ්වාසය නොකරන්නන් එය කවදා එයිද යනුවෙන් නබිතුමාගෙන් විහිළු සහගතව ඇසූ විට අල් කුර්ආන් මෙසේ පවසයි. 'එහි දැනුම අල්ලාහ්ගෙන් පමණක් වන අතර බොහෝ මිනිසුන් එය නොදනිති' (79:42-46)
- ඉතිහාසයේ බොහෝ මරණයට පත් කොට නැවත නැගිටීමට හේතු වූ සිදුවීම් තිබේ.
  ඝාතනයට ලක් වූ තැනැත්තාට ගව මස් තුලින් ගහන විට ඔහු නැවත නැගිටීම (මූසා (අලෛ) කාලයේදී)
- තාර්කික සාක්ෂි මගින් අවසන් දිනය ගැන තහවුරු කරයි.
  - ආරම්භයක් තිබේ නම් අවසානයක්ද තිබිය යුතුය.
  - මැවීමට බලය ඇති අල්ලාහ්ට විනාශ කිරීමටද බලය ඇත.
  - සියල්ල විනාශ වන බව විද්‍යාව පිළිගනී.

**(ලකුණු 05)**

Department of Examinations - Sri Lanka

(ii) ඉස්ලාමීය ස්වර්ගස්ථ ජීවිතය

- මුස්ලිම්වරයෙකුගේ ලෞකික ජීවිතයේ අවසාන ඉලක්කය
  ලෞකික ජීවිතයේ කුසල් වලින් පිරි දේව තෘප්තියට පත් වූ මිනිසුන්ට ස්වර්ගයක් සැදී ඇත. (3:133)
- ස්වර්ගයේ දොරටු
  'ස්වර්ගයේ දොරටු 08ක් ඇත. ඉන් එකක් රයියාන් වේ. එහි උපවාස කරන අය හැර වෙන කිසිවෙකුට ඇතුළු විය නොහැක' (බුහාරි)
- ස්වර්ගයේ පිළිගැනීමේ නිළධාරීන්
  'ඔබට සාමය හා සතුටු ලැබේවා. සදාකාලික ඔබ මෙහි පිවිසෙන්න.' යනු පවසයි. (39:73)
- ස්වර්ගයේ පස්
  ස්වර්ගයේ පස් සුවඳ 'කස්තුරි' බව තිබුණි. (බුහාරි)
- ස්වර්ගයේ මාළිගාවන්
  'ඔවුන්' (ස්වර්ගයෙහි) සම්භාව්‍ය මන්දිරවල සැනසීමෙන් සිටිති. (34:37)
- ස්වර්ගයේ ගස්
  ස්වර්ගයේ ගසක් ඇත. එහි සෙවනෙහි සංචාරකයාට වසර සීයක් ගමන් කළත් එය තරණය කළ නොහැක. (බුහාරි)
- ස්වර්ගයේ කෑම
  ඔවුන් ආස කරන පළතුරු හා කුරුල්ලන්ගෙ මස් ද අනුභව කරයි. (56:20:21)
- ගංගාවල්
- බඳුන්
  රන් රිදී බඳුන්වල පමණක් ඔවුන්ට ආහාර සපයනු ලැබේ. (43:71)
- ඇඳුම් පැලඳුම්
  සුන්දුස්, ඉස්තබ්රක් යනු ඇඳුම් (45:51:53)
- භාර්යාවන්
  හුරුල් ඊන් (44:54)
- පවුල (51:52)
- දේව දර්ශනය
  'සඳ තදබදයකින් තොරව දකින ආකාරයට ඔබ ඔබේ දෙවියාව දකියි' (බුහාරි)

**(ලකුණු 05)**

(iii) ඉස්ලාමීය විවාහයට පෙර සූදානම

පෙර සූදානම විවාහයකදී පළමු අදියර වේ.

- **සැමියා බිරිඳ තේරීම**
  - විවාහ කිරීමට සුදුසු අජ්නබි ද යැයි තවහුරු කිරීම. (2:221)
  - කාන්තාවක් විවාහ වීමට කරුණු 04ක් තිබේ. එය ධනය, ලස්සන, පවුල හා ආගමික හැඟීම් වේ. ඒවායින් ආගමික හැඟීම් ඇති තැනැත්තිය විවාහ කරන්න. ඒයින් ඔබට ආශිර්වාදය ලැබේ. (බුහාරි)
- **මනාමාලි බැලීම**

ඔබට කාන්තාවක් විවාහ කර ගැනීම සඳහා කතා කරන්නේ නම් ඇයව ජාබිර් (රලි) විවාහ කර ගැනීමට ඔබව පෙළඹවීම සඳහා ඔහු ඇය දෙස බැලීමට ඉඩ දෙන්න.



Department of Examinations - Sri Lanka

- **මනාලයත් මනාලියගේ කැමැත්ත ලබා ගැනීම**
  - ➢ මනාලියගේ අනුමැතිය ලබා ගැනීම
  - ➢ කන්‍යාවන්ගෙන් (විවාහය සඳහා) අවසරය ඉල්ලා සිටිය යුතු අතර ඇයගේ අවසරය නම් නිහඬව සිටීමයි. (මුස්ලිම්)

- **ගැලපීම නිරීක්ෂණය කිරීම (අල් කුෆ්උ)**
  - ➢ මෙය විවාහ සිදුවීමට අවශ්‍ය නීති රීති නොවුනත් විවාහ ජීවිතය සතුටින් තිබීමට හේතුවක් වේ.
  - ➢ ආගම්, හැඟීම්, වයස, පවුල් තත්වය, අධ්‍යාපන මට්ටම, ප්‍රතිපත්ති, උස යනාදී කරුණු අනුව ගැලපීම් බැලීම වඩාත් සුදුසුය.

***(මෙවැනි කරුණු 05ක් ලියා ඇත්නම් 1 X 5 = ලකුණු 05)***

(iv) අරාබි-ශ්‍රී ලංකා සබඳතා

- ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම ශ්‍රී ලංකා අරාබි සබඳතාවයන්ට දායක විය. (ශ්‍රී ලංකාව නැගෙනහිර - බටහිර සමුද්‍ර වෙළඳ මාර්ගයේ පිහිටා තිබීම)
- අරාබි වෙළඳුන්ට අවශ්‍ය භාණ්ඩ මෙහි තිබීම. (මැණික්, ඇත්දළ සහ කුරුඳු, කරාබුනැටි, එනසාල්, සාදික්කා වැනි සුවඳ විලවුන්)
- පානීය ජලය, නැව ගාල් කිරීමට, අළුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් පහසුකම් තිබීම.
- වෙළඳ ගමන් වලදී සෘතුමය මාරු සුළං වාසිදායක වෙන තෙක් රැඳී සිටීමට අවශ්‍ය සියළු පහසුකම් සහිත වරාය පහසුකම් ශ්‍රී ලංකාවේ තිබීම.
- ස්වදේශකයන් විදේශ වෙළදාමේ නොයෙදීම නිසා ස්වදේශී රජවරු අරාබි වෙළඳුන්ට සහාය දුන්හ.
- ශ්‍රී පාදය නැරඹීමට අරාබිවරුන්ගේ පැමිණීම.
- දේශීය ආගන්තුක සත්කාරය හා වෙළදාම සඳහා සුවපහසු පරිසරය.
- ස්වදේශීය කාන්තාවන්වන විවාහ කර ගැනීම.
- අරාබිවරුන්ගේ ගුණ ධර්ම, අවංක භාවය
- ක්‍රි පෙර සිටම ආරාබිවරුන් පැමිණි බවට සාධක හමු වී ඇත.
- පණ්ඩුකාභය රජුගේ කාලයේ අනුරාධපුර අගනුවරයේ යොනාස් යනුවන්ට වෙනම ප්‍රදේශයක් වෙන් කළ බව මහා වංශය සඳහන් කරයි. එය අරාබි වෙළඳුන් බව විල්හෝට් ෆයිගර් හා ආනන්ද ගුරුගේ සඳහන් කරයි.
- අනුරාධපුරයෙහි අරාබිවරුන්ගේ නිවස අලංකාරව සාදා තිබුණි.
- විජයන් හා ඔහුගේ සහායන් ලංකාවට පැමිණීමට පෙර යෙමන් රට අරාබිවරුන් ලංකාවේ ජීවත් වූහ.
- ක්‍රි.පූ. 04 වැනි සියවසරේ ඉන්දියාවේ කායල් පට්ටනම්, කීලක්කරයි. කල්ලික්කෝට්ටේ ආදි ස්ථානවල ද ලංකාවේද අරාබිවරුන් පුළුල් ලෙස ජීවත් වූහ.
- අරාබි වෙළදුන් මලබාර් වෙරළබඩේ හා ලංකාවේ ශක්තිමත් ව ජීවත් වූ බව පිලිනි පවසයි.
- මීට අවුරුදු 2000 ඉපැරණිම අරාබිවරුන් ලංකාවේ වාසය කළ බැවින් ඔවුන් ආදී වාසීන්ගේ පැරණියයි ආචාර්ය බාලේන්ද්‍රා සඳහන් කරයි.



Department of Examinations - Sri Lanka

- ක්‍රි.ව 3,4 සියවස්වල අරාබි දූපත සිට පැමිණි නැව් මෙහි ගාල් කර තිබූ බව සිරිමා කිරිබමුණා පවසයි.
- දෙදුරු ඔය යොන ගඟ නැතිනම් අරාබි ගඟ ලෙෂ හැඳින් වේ. දෙදුරු ඔයට උතුරු පස අරාබි ජාතීන් ජීවත් වූහ. (Ceylon in ptomay's geography - J.R.සින්න තම්බි)

මේ කරුණු සියල්ලම ඉස්ලාම් අරාබි දූපතේ ව්‍යාප්ත වීමට පෙර සිටම අරාබි ශ්‍රී ලංකා සම්බන්දතා ශක්තිමත්ව තිබූ බවත් ඔවුන් මෙහි ජීවත් වී සිටි බවත් තහවුරු කරයි.

***(මෙවැනි කරුණු පහක් ලියා ඇත්නම් 5 x 2 = ලකුණු 05යි.)***

Department of Examinations - Sri Lanka